සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

බෞද්ධ ශිෂ්ටාචාරය I
பௌத்த நாகரிகம் I
Buddhist Civilization I

**45 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **ඉතාමත් ගැළපෙන** පිළිතුර තෝරාගෙන එය **පිළිතුරු පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

**1.** බ්‍රාහ්මණ සම්ප්‍රදායට අයත් ප්‍රමුඛ ඉගැන්වීමක් වූ ආපද් ධර්ම හා සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ හොඳින් කියවන්න.

A - ශූද්‍රයාට ආපද් ධර්ම අහිමි විය.
B - ආපද් ධර්ම දේව නිර්මාණවාදී බ්‍රාහ්මණ ආගමික ඉගැන්වීමකි.
C - ආපද් ධර්ම මගින් පහළ කුලවල අයට ඉහළ කුලවලට අයත් රැකියාවල නියැලීමට අවස්ථාව ලැබුණි.
D - ආපදාපන්න අවස්ථාවලදී බමුණෝ සමාජයේ යහ පැවැත්ම වෙනුවෙන් පෙරමුණ ගෙන කටයුතු කළහ.
E - ආපද් ධර්ම ක්‍රියාත්මක කිරීමේ බලය ක්ෂත්‍රියන්ට පවරා තිබුණි.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් ආපද් ධර්ම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ දෙක ඇතුළත් වරණය තෝරන්න.

(1) A සහ B (2) A සහ C (3) B සහ C (4) B සහ D (5) B සහ E

**2.** බුද්ධකාලීන භාරතීය සමාජය ක්‍රමයෙන් වාණිජකරණයට හා නාගරීකරණයට නතු වූ බව තහවුරු කෙරෙන සාධක රැසක් හඳුනාගත හැකි ය. පහත සඳහන් ප්‍රකාශ අතර ඒ හා සම්බන්ධ සාධක කිහිපයක් අන්තර්ගත ය.

A - වෙළෙඳුන් වෘත්තීය වශයෙන් සංවිධානය වීම
B - මුදල් භාවිතයට පැමිණීම
C - වෙළඳ නගර බිහිවීම
D - කෘෂිකර්මාන්තය ජීවනෝපාය වීම
E - අන්තර්ජාතික මාර්ග පද්ධතියක් බිහිවීම

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් බුද්ධකාලීන භාරතීය සමාජය වාණිජකරණයට හා නාගරීකරණයට නතු වූ බව තහවුරු කෙරෙන සාධක තුනක් ඇතුළත් වරණය තෝරන්න.

(1) A, B සහ C (2) A, B සහ D (3) A, C සහ D
(4) B, C සහ D (5) C, D සහ E

**3.** "පෘථිවියේ සියලු ප්‍රාණීන් මරා එක ම මස් ගොඩක් කළ ද ඒ හේතුවෙන් උපදනා පාපයක් නැතැ"යි ඉගැන්වූ බුද්ධකාලීන ආගමික ශාස්තෘවරයා වූයේ,

(1) අජිත කේසකම්බලී ය. (2) පූරණ කස්සප ය. (3) මක්ඛලී ගෝසාල ය.
(4) පකුධ කච්චායන ය. (5) සංජය බෙල්ලට්ඨිපුත්ත ය.

**4.** බුද්ධකාලීන භාරතීය දේශපාලන තොරතුරු ගවේෂණයේදී ප්‍රකට ව පෙනෙන වැදගත් සංකල්පයක් ලෙස "මත්ස්‍ය න්‍යාය" හඳුනාගත හැකි ය. එය

(1) රටවැසියන් පාලනය කිරීමේ ක්‍රමවේදය හා සම්බන්ධ න්‍යායකි.
(2) රාජ්‍යයක සම්පත් බෙදී යායුතු ආකාරය පිළිබඳ න්‍යායකි.
(3) මහාරාජ්‍යයන්ගේ දේශසීමා පුළුල් කර ගැනීමට ක්‍රියාත්මක කරන ලද න්‍යායකි.
(4) අසල්වැසි රාජ්‍යයන් හා සුහද ව කටයුතු කිරීම පිළිබඳ න්‍යායකි.
(5) කුඩා රාජ්‍යයන්ගේ දේශසීමා පුළුල් කර ගැනීමට ක්‍රියාත්මක කරන ලද න්‍යායකි.

[දෙවැනි පිටුව බලන්න

5. බ්‍රාහ්මණ ආගමික ඉගැන්වීම් අනුව වානප්‍රස්ථ ආශ්‍රමයේදී තවුස්දම් රැකීම සඳහා වනගත වන විට සිය අභිමතය පරිදි බිරිඳ ද කැටුව යා හැකි විය. එම අනුමැතිය ලැබුණේ,
   (1) බ්‍රාහ්මණ වර්ණයට පමණි.
   (2) බ්‍රාහ්මණ හා ක්ෂත්‍රිය වර්ණ දෙකට පමණි.
   (3) ක්ෂත්‍රිය හා වෛශ්‍ය වර්ණ දෙකට පමණි.
   (4) බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය හා වෛශ්‍ය වර්ණ තුනට පමණි.
   (5) බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය හා ශුද්‍ර වර්ණ හතරටම ය.

6. බුදුසසුනේ අගසව් තනතුරු ලැබූ සැරියුත් මුගලන් දෙනම බුදුරදුන්ගේ ශ්‍රාවකයන් වීමට පෙර අයත් ව සිටියේ ....................... ආගමික සම්ප්‍රදායට ය.
   (1) ජෛන (2) ජටිල (3) පරිබ්‍රාජක (4) ආජීවක (5) අචේලක

7. පහත සඳහන් ප්‍රකාශ හොඳින් කියවන්න.
   A - සියලු සැප දුක් පෙර කරන ලද කර්මයට අනුව සිදු වේ.
   B - දුකින් නිදහස් වීම සඳහා පෙර කරන ලද කර්ම ගෙවා දැමිය යුතු අතර නව කර්ම නො කළ යුතු ය.
   C - කාය දණ්ඩය වඩාත් ප්‍රබල වේ.
   D - සියලු ඇල්දියෙන් වැළකීම උසස් ශීලයකි.
   E - නිත්‍ය වූ ආත්මයක් ඇත.

   ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් නිගණ්ඨනාතපුත්ත ආචාර්යවරයාගේ ඉගැන්වීම් වැඩි ම ප්‍රමාණයක් ඇතුළත් වරණය තෝරන්න.
   (1) A, B සහ C (2) A, B සහ D (3) A, B, C සහ D
   (4) A, B, C සහ E (5) A, B, C, D සහ E යන සියල්ල ම

8. හිස්තැනට වඩාත් සුදුසු වාක්‍යය තෝරන්න.
   බුද්ධකාලීන ශ්‍රමණ සම්ප්‍රදායට ඇතුළත් ජටිලයෝ ....................... .
   (1) අතින් දණ්ඩක් ගෙන සිටි අතර, අත්තකිලමථානුයෝගී ව උග්‍ර තපස් ව්‍රත අනුගමනය කළහ.
   (2) තමා කෙලෙස් ගැටවලින් තොර යැයි කියා සිටියහ.
   (3) ගිනි දෙවියන් පිදීමට හා උදක පාරිශුද්ධියට ප්‍රමුඛතාවක් ලබාදුන්හ.
   (4) සන්සුන් ඉඳුරන් ඇති කසාවත් දරන සංවර පිරිසක් වූහ.
   (5) ශ්වේතාම්බර හා දිගම්බර යනුවෙන් දෙපිරිසක් ලෙස උග්‍ර තපස් ව්‍රත අනුගමනය කළහ.

9. බඹ සුර යකුන් තද
   දමනය කර තමන් ලද
   සෙත් දී මුනිඳු සඳ
   ............................ ............

   ඉහත සඳහන් කවියෙන් විස්තර වන බුදුගුණය නම් කරන්න.
   (1) විජ්ජාචරණ සම්පන්න (2) පුරිසදම්මසාරථී (3) භගවා
   (4) ලෝකවිදූ (5) සත්ථා

10. “බුදුරජාණන් වහන්සේ ලෞකික ආශා නමැති ගිනිගත් නිවස තුළ දැවෙන දරුවන් බේරා ගැනීමට මාර්ග යොදන්නා වූත්, බේරා ගැනීමෙන් පසු නිර්වාණය නමැති ආරක්ෂක ස්ථානයට මග පෙන්වන්නා වූත් පියකු බඳු ය.”
   බුදුරජාණන් වහන්සේ පිළිබඳ මෙම ඇගයීම සිදුකරන ලද්දේ කවුරුන් විසින් ද?
   (1) මහාචාර්ය ලක්ෂ්මී නරසු (2) මහාචාර්ය සොණ්ඩර්ස්
   (3) එඩ්වින් ආර්නෝල්ඩ් (4) ඇල්බට් අයින්ස්ටයින්
   (5) මැක්ස් මුලර්

11. “ඵුට්ඨස්ස ලෝක ධම්මේහි චිත්තං යස්ස න කම්පති” යන මංගල සූත්‍රාගත ප්‍රකාශයෙන් ප්‍රකට කෙරෙන මංගල කරුණ බුදුරජාණන් වහන්සේගේ ............................ සමාන වේ.
   (1) පද්මාකාර ජීවිතයට (2) අරහං බුදුගුණයට (3) මහා ප්‍රඥාවට
   (4) මහා කරුණාවට (5) තාදී ගුණයට

[තුන්වැනි පිටුව බලන්න

**12.** පහත දැක්වෙන්නේ විශාඛා මහෝපාසිකාවගේ හා නකුලමාතාවගේ චරිත කථාවලට අදාළ ප්‍රකාශ පහකි.

A - අගතනතුරු ලබා තිබීම
B - ස්වාමියාගේ පියාණන්ට ධර්මාවබෝධය සඳහා මගපෙන්වීම
C - සොළොස්වසක් තිස්සේ ගෘහස්ථ බ්‍රහ්මචරියාව පිරීම
D - ආරාම තනා බුදුරදුන්ට පූජා කිරීම
E - මාර්ගඵලවලට පත් වී සිටීම

ඉහත ප්‍රකාශ අතුරින් විශාඛා මහෝපාසිකාවගේ හා නකුලමාතාවගේ චරිත කථාවලට පොදු වූ ප්‍රකාශ දෙක පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A සහ B (2) A සහ C (3) A සහ D (4) A සහ E (5) B සහ C

**13.** පහත දැක්වෙන්නේ බුද්ධකාලීන ආගමික හා දාර්ශනික පසුබිම තුළ ප්‍රකට ව පැවති ඉගැන්වීම් කිහිපයකි.

A - දේව නිර්මාණවාදය
B - නියතිවාදය
C - පුබ්බේකතහේතුවාදය
D - අධිච්චසමුප්පන්නවාදය
E - අමරාවික්ඛේපවාදය

සමාජ සංස්ථාවන්ගේ ප්‍රභවය හා විකාශය පිළිබඳ අග්ගඤ්ඤ සූත්‍රාගත විවරණයෙන් ප්‍රතික්ෂේප වන බ්‍රාහ්මණ ඉගැන්වීම ඇතුළත් වරණය වන්නේ කුමක් ද?

(1) A (2) B (3) C (4) D (5) E

**14.** බුදුදහම කම්මවාදී, කිරියවාදී, විරියවාදී ධර්මයකි. එබැවින් පුද්ගලයා විසින් සචේතනික ව සිදුකරනු ලබන හොඳ-නරක ක්‍රියාවල විපාකය කර්තෘ විසින් ම දැරිය යුතුබව බුදුසමයේ ස්ථාවරයයි. සචේතනික ක්‍රියාවේ විපාකය කර්තෘ වෙත පැවරෙන බැවින් ක්‍රියාව කරන්නාට ඒ සඳහා ............................ පවත්නා බව බුදුසමයේ පිළිගැනීමයි.

(1) ස්වච්ඡන්දතාවක් (2) විපාකයක් (3) විනිශ්චයක්
(4) උත්තේජනයක් (5) අධිෂ්ඨානයක්

**15.** පාලන තන්ත්‍රයේ යහපැවැත්ම පිණිස පාලකයා විසින් අනුගමනය කළයුතු දේශපාලන මූලධර්ම රැසක් බෞද්ධ දේශපාලන දර්ශනයේ අන්තර්ගත වේ. එහෙත් ඇතැම් පාලකයෝ තම ඥාතීන්ට හා හිතවතුන්ට පක්ෂග්‍රාහී ව කටයුතු කිරීමෙන් හා විරුද්ධවාදීන්ගෙන් පළි ගනිමින් වෛර සහගත ව කටයුතු කිරීමෙන් රාජ්‍යය හා ජනතාව පරිහානියට පත් කරති. මෙවැනි තත්ත්වයක් ඇතිවීමට වඩාත් ම බලපෑ හැකි හේතුව ලෙස හඳුනාගත හැක්කේ පාලකයන්

(1) සතර සංග්‍රහ වස්තු අනුගමනය නො කිරීමයි.
(2) පඤ්චශීල ප්‍රතිපදාව අනුගමනය නො කිරීමයි.
(3) ලෝකපාලන ධර්ම අනුව කටයුතු නො කිරීමයි.
(4) සප්ත අපරිහානිය ධර්ම අනුගමනය නො කිරීමයි.
(5) සතර අගතියෙන් අගතියට යාමයි.

**16.** බෞද්ධ දේශපාලන සිද්ධාන්ත අනුව පාලකයන් මහජනතාවගේ ප්‍රශ්න හා දුක් පීඩාවන් පිළිබඳ සංවේදී ව හා නම්‍යශීලී ව ක්‍රියා කළ යුතු ය. දශ රාජධර්ම අතර මෙම අදහස ඇතුළත් රාජධර්මය ලෙස හඳුනාගත හැක්කේ,

(1) ඉවසීමයි. (2) පරිත්‍යාගයයි. (3) මෘදුබවයි.
(4) ඍජුබවයි. (5) විරෝධාකල්ප නො දැරීමයි.

**17.** රාජ්‍ය පාලනයට අදාළ බෞද්ධ මූලාශ්‍රයාගත අදහස් ඇතුළත් පහත සඳහන් ප්‍රකාශ කියවන්න.

A - දරිද්‍රතාවෙන් පීඩා විඳින ජනතාවට යහපත් ආර්ථිකයක් ගොඩනගා ගැනීමට අනුග්‍රහ දැක්විය යුතු ය.
B - තම රටෙහි වෙසෙන උගත් මහණ බමුණන්ගේ අවවාද අනුශාසනා ලබාගත යුතු ය.
C - වැඩිහිටියන්ට ගරු බුහුමන් කළයුතු අතර ඔවුන්ගේ වචනවලට සවන් දියයුතු ය.
D - රට තුළ උද්ගත වන අපරාධ මර්දනය කොට ජනතාවට බියෙන් තොර ව ජීවත්වීමට අවශ්‍ය පරිසරය සකස් කළයුතු ය.
E - ඒ ඒ ක්ෂේත්‍රවල දක්ෂතා හා හැකියාව ඇති පිරිස් හඳුනාගෙන අවශ්‍ය ප්‍රාග්ධනය, වැටුප්, ආහාර, යටිතල පහසුකම් ආදිය සැපයීමෙන් රටවැසියන්ගේ ආර්ථිකය නගා සිටුවිය යුතු ය.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් දස සක්විතිවත්වලට ඇතුළත් **නො වන** ප්‍රකාශ දෙක ඇතුළත් වරණය තෝරන්න.

(1) A සහ B (2) A සහ C (3) A සහ D (4) B සහ E (5) C සහ E

**18.** පහත සඳහන් ප්‍රකාශ අතුරින් හොඳ-නරක ක්‍රියා විනිශ්චයෙහිලා යොදා ගැනෙන නිර්ණායකයක් ලෙස **නො සැලකිය** හැකි ප්‍රකාශය තෝරන්න.

(1) තමා උපමා කොට ප්‍රාණඝාතාදී පාපක්‍රියාවලින් වැළකිය යුතු ය.
(2) පරලොව යන පුද්ගලයන්ට පිහිටට පැමිණෙන්නේ පින බැවින් පිංකම් කළයුතු ය.
(3) විපාකය දුක් සහගත වේ නම් එබඳු ක්‍රියා සිදුකිරීමෙන් වැළකිය යුතු ය.
(4) කැඩපතකින් තම සිරුර නිරීක්ෂණය කරන්නා සේ කායික, වාචික හා මානසික ක්‍රියා ප්‍රත්‍යවේක්ෂා කළයුතු ය.
(5) රාග, ද්වේෂ, මෝහ සහගත ක්‍රියා පාප ක්‍රියා ලෙස තීරණය කළයුතු ය.

**19.** "වෙසක් පොහෝ දින ගමේ විහාරස්ථානයට පැමිණි උපාසක උපාසිකාවෝ පෙහෙවස් සමාදන් වීමෙන් අනතුරුව ගාථා සජ්ඣායනය කරමින් උදෑසන ආහාර බුද්ධපූජාව පැවැත්වූහ. සියලු ලෝ සතුන් වෙත මෙත් සිත පතුරවමින් මෛත්‍රී භාවනාවේ යෙදුණු සිල්වත් පිරිස ධර්ම දේශනාවට සවන් දුන්නේ කර්ම ඵල විශ්වාසය පිළිබඳ සම්‍යග් දෘෂ්ටියෙහි පිහිටා ය."

ඉහත සඳහන් ප්‍රකාශය තුළ දශපුණ්‍යක්‍රියාවලින් කොපමණ ප්‍රමාණයක් අන්තර්ගත වේ ද?

(1) දෙකක් (2) තුනක් (3) හතරක් (4) පහක් (5) හයක්

**20.** රිය සකට කඩ ඇණයක් නැති කල්හි රථයට ගමනක් නැත. කඩ ඇණය ඇති කල්හි ම රියෙහි මනා ගමනය සිදු වේ. එපරිද්දෙන් සමාජයක් යහපත් ආකාරයෙන් පැවතීමට අවශ්‍ය සාධක හතරක් බෞද්ධ ඉගැන්වීම්වල ඇතුළත් වේ. ඒවා ............................ නමින් හැඳින්වේ.

(1) සතර බ්‍රහ්ම විහරණ (2) සතර සංග්‍රහවස්තු
(3) සතර අගති විරති (4) සතර කර්මක්ලේශ
(5) සතර සතිපට්ඨාන

**21.** ගෘහස්ථ ජීවිතයේ ආචාර ධර්ම පිළිබඳ මෙන් ම ගිහියාගේ ආර්ථික කටයුතු පිළිබඳ ව ද වටිනා සදුපදේශයන් අන්තර්ගත සූත්‍රයක් ලෙස සිගාලෝවාද සූත්‍රය හඳුනා ගතහැකි ය. එහි දැක්වෙන 'ඒකේන භෝගේ භුඤ්ජෙය්‍ය...' යනාදි ගාථාවෙන් පැහැදිලි වන්නේ ............................ පිළිබඳ උපදේශයකි.

(1) ධනෝපායනය (2) ධන කළමනාකරණය
(3) ධන සංරක්ෂණය (4) ධන ආයෝජනය
(5) ධන පරිභෝජනය

**22.** බුදුසමය අනුදත් පරිභෝජන දර්ශනයෙහි එන සංකල්ප අතුරින් 'නිස්සරණ පඤ්ඤො' යන්නෙන් අදහස් කර ඇත්තේ,

(1) 'ගැති නො වී ධනය පරිහරණය කළයුතු ය' යන්නයි.
(2) 'මූර්ඡා නො වී ධනය පරිහරණය කළයුතු ය' යන්නයි.
(3) 'ආදීනව දකිමින් ධනය පරිහරණය කළයුතු ය' යන්නයි.
(4) 'අත්හැරීමේ නුවණින් යුතු ව ධනය පරිහරණය කළයුතු ය' යන්නයි.
(5) 'දැඩි උපාදානයෙන් තොර ව ධනය පරිහරණය කළයුතු ය' යන්නයි.

**23.** පරිසර සංරක්ෂණය පිළිබඳ ඉතා වැදගත් තොරතුරු ඇතුළත් සංයුත්තනිකායේ වනරෝප සූත්‍රයෙහි දිවා රෑ පිං වැඩෙන පරිසර හිතකාමී කටයුතු කිහිපයක් දක්වා තිබේ. පහත සඳහන් වරණ අතුරින් එම සූත්‍රයෙහි සඳහන් **නො වන** පිංකමක් වන්නේ,

(1) අම්බලම් ඉදිකිරීමයි. (2) වනාන්තර වැවීමයි.
(3) පාලම් ඒ දඬු තැනීමයි. (4) පැන් පොකුණු තැනීමයි.
(5) මංමාවත් තැනීමයි.

**24.** බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ හඳුන්වා දීමේදී මඩෙන් ඉස්මතු ව ප්‍රබුද්ධ වන නෙළුම මඩෙහි යළි නො ගැටී, පවිත්‍ර ව සුවඳවත් ව තිබෙන්නාක් මෙන්, තමන් ද කිලිටි වූ කාමභෝගී ජන සමාජයෙහි ඉපිද, ඉන් ඉස්මතු ව ශ්‍රේෂ්ඨ වූ සම්බුද්ධත්වයට පත් වූ බව දැක්වෙන උපමාවෙන් නිරූපණය වන්නේ උන්වහන්සේගේ

(1) පද්මාකාර ජීවිතයයි. (2) තාදී ගුණයයි.
(3) පරමාදර්ශීබවයි. (4) පරාර්ථකාමීත්වයයි.
(5) පරිසර හිතකාමීත්වයයි.

**25.** පහත සඳහන් ප්‍රකාශ අවධානයෙන් කියවන්න.

A - බුදුසසුන තුළ පැවැති විෂමතා දුරලීමට කාශ්මීරයේ කුණ්ඩලවන විහාරයේදී ධර්ම සංගායනාවක් පැවැත්වීම
B - එම සංගායනාව අවසානයේදී විභාෂා නමින් අටුවා ග්‍රන්ථ සම්පාදනය කිරීම
C - සංගායිත ධර්මය තඹපත්වල ලියා මඤ්ජුසාවක බහා ස්තූපයක තැන්පත් කිරීම
D - සංගායනාවෙන් අනතුරුව මධ්‍යාසියාව කේන්ද්‍රකර ගනිමින් ධර්ම ප්‍රචාරක වැඩ පිළිවෙළක් ඇරඹීම

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් කණිෂ්ක රජතුමාගේ අනුග්‍රහයෙන් පවත්වන ලද සිවුවන ධර්ම සංගායනාවට අදාළ වැඩි ම කරුණු ගණනක් ඇතුළත් වරණය තෝරන්න.

(1) A සහ B (2) A, B සහ C (3) A, B සහ D
(4) B, C සහ D (5) A, B, C සහ D

**26.** ඒ ඒ දිශාවන්ට අයත් පුද්ගලයන් විසින් ඉටු කළයුතු යුතුකම් හා වගකීම් හැට එකක් සිගාලෝවාද සූත්‍රයේ ඇතුළත් වේ. ඉන් පහක් පහත දැක් වේ.

A - කල්‍යාණෙන මනසා අනුකම්පති - යහපත් සිතින් අනුකම්පා කිරීමෙන්
B - පාපා නිවාරෙන්ති - පවින් වැළැක්වීමෙන්
C - සිප්පං සික්ඛාපෙන්ති - ශිල්පීය ඥානය ලබාදීමෙන්
D - කල්‍යාණෙ නිවේසෙන්ති - යහපතෙහි යෙදවීමෙන්
E - සුවිනීතං විනෙන්ති - මනාව හික්මවාලීමෙන්

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් දෙමාපියන් හා මහණ බමුණන් යන දෙපක්ෂයේ ම යුතුකමක් වන්නේ කුමක් ද?

(1) A (2) B (3) C (4) D (5) E

**27.** පිරිහීමේ දොරටුවක් ලෙස පරාභව සූත්‍රයෙහි ඇතුළත් **නො වන** කරුණ වන්නේ,

(1) නින්දේ ඇලීමයි. (2) පිරිස් සමග කාලය ගතකිරීමයි.
(3) සතර අගතියෙන් අගතියට යාමයි. (4) අලසබවයි.
(5) නිතර කිපෙන සුළුබවයි.

**28.** පහත සඳහන් කරුණු අතුරින් මංගල සූත්‍රයෙහි ඇතුළත් මංගල කරුණක් වන්නේ,

(1) අල්ප කෘත්‍ය ඇති බවයි.
(2) සැහැල්ලු පැවතුම් ඇති බවයි.
(3) පෙර කළ පිං ඇති බවයි.
(4) ශාන්ත වූ ඉන්ද්‍රියන් ඇති බවයි.
(5) අනතිමානී බවයි.

**29.** අත්තානං චෙ පියං ජඤ්ඤා
රක්ඛෙය්‍ය නං සුරක්ඛිතං
තිණ්ණමඤ්ඤතරං යාමං
.........................................

මෙම ධම්මපද ගාථාවේ හිස්තැනට සුදුසු පදය තෝරන්න.

(1) තං වෙ පරම දුක්කරං (2) පටිජග්ගෙය්‍ය පණ්ඩිතො
(3) පුරාණානි අනුත්ථුනං (4) වජිරං'වස්මමයං මණිං
(5) සෙය්‍යො හොති න පාපියො

**30.** පළමු ධර්ම සංගායනාවේදී ගනු ලැබූ තීරණයකට අනුව ධර්මධර හා විනයධර මහතෙරවරුන් ප්‍රධාන උන්වහන්සේලාගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවලට ධර්ම විනය කටපාඩමින් පවත්වාගෙන යාමට පවරන ලදී. එම තීරණයට අනුව අංගුත්තර නිකාය කටපාඩමින් පවත්වාගෙන යාමට පවරන ලද්දේ,

(1) ආනන්ද මහරහතන් වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවටයි.
(2) සැරියුත් මහරහතන් වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවටයි.
(3) මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවටයි.
(4) උපාලි මහරහතන් වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවටයි.
(5) අනුරුද්ධ මහරහතන් වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවටයි.

**31.** පළමු ධර්ම සංගායනාව පිළිබඳ චුල්ලවග්ග පාළියේ සඳහන් විස්තරයට අනුව මහාකාශ්‍යප හිමියන් සංගායනාව පැවැත්වීම පිළිබඳ යෝජනාව ඉදිරිපත් කරමින් සංගීතිකාරක භික්ෂූන් හමුවේ කරන ලද ප්‍රකාශය වන්නේ,

(1) "අනාගතයෙහි අධර්මය හා අවිනය ප්‍රබල වී ධර්මය හා විනය දුර්වල වේ" යන්නයි.

(2) "අනාගතයෙහි ධර්මය හා විනය ප්‍රබල වී අධර්මය හා අවිනය දුර්වල වේ" යන්නයි.

(3) "අනාගතයෙහි අධර්මවාදීන් හා අවිනයවාදීන් දුර්වල වී ධර්මවාදීන් හා විනයවාදීන් ප්‍රබල වේ" යන්නයි.

(4) "අනාගතයෙහි ශාසනය තුළ ධර්ම විනය සම්බන්ධයෙන් බරපතල ගැටලු ඇති වේ" යන්නයි.

(5) "සංගායනාවෙන් ශාසනය පිරිසිදු වන බැවින් අනාගතයෙහි ධර්ම විනය සම්බන්ධයෙන් ගැටලු ඇති නො වේ" යන්නයි.

**32.** ප්‍රථම ධර්ම සංගායනාවේදී මුලින් විනය සංගායනා කිරීමට තීරණය කෙළේ

(1) 'මුලින් ම විනය සංගායනා කළ යුතු යැ'යි බුද්ධ නියමයක් පැවති නිසා ය.

(2) විනයධර භික්ෂූන්ගේ බලපෑම ප්‍රබල වූ නිසා ය.

(3) 'ධර්මයට වඩා විනය උසස් යැ'යි සම්මතයක් පැවති නිසා ය.

(4) විනය වනාහි ශාසනයේ ආයුෂ ලෙස සැලකූ නිසා ය.

(5) ශාසනය තුළ විනය පිරිහී පැවති නිසා ය.

**33.** 'දුසිල් භික්ෂූන් සමග විනය කර්ම කළ නො හැකි යැ'යි ධර්මාශෝක රාජ්‍ය සමයෙහි ශික්ෂාකාමී භික්ෂූහු විනය කර්ම සිදුකිරීමෙන් වැළකී සිටියහ. මෙම ගැටලුව විසඳීමෙහිලා අශෝක රජතුමා ගත් ප්‍රමුඛ පියවර කුමක් ද?

(1) අශෝක රජතුමා මොග්ගලීපුත්ත තිස්ස මාහිමියන්ගෙන් කරුණු විමසා බැලීමයි.

(2) විනය කර්ම කරන ලෙස රාජ නියෝගයක් නිකුත් කිරීමයි.

(3) කරුණු සොයා බැලීමට ඇමතිවරයකු පත් කිරීමයි.

(4) විනය කර්ම සිදු නො කරන්නේ නම් බුදුසසුනට රාජ්‍යානුග්‍රහය නො දීමට තීරණය කිරීමයි.

(5) ගැටලුව විසඳීමට මහ තෙරවරුන් පස්නමකගෙන් යුතු උබ්බාහිකාවක් පත්කිරීමයි.

**34.** ධර්මාශෝක අධිරාජයා බෞද්ධයකු වුව ද අනෙකුත් ආගමිකයන්ට අවශ්‍ය පහසුකම් සපයා දුන් බවත්, ආජීවකයන්ට ආරාම පූජා කළ බවත් සඳහන් වන්නේ,

(1) කාල්සි ගිරි ලිපියේ ය. (2) ගිරිනාර් ගිරි ලිපියේ ය. (3) බරාබර් ගිරි ලිපියේ ය.
(4) භාබෲ ගිරි ලිපියේ ය. (5) කන්දහාර් ගිරි ලිපියේ ය.

**35.** භාරතීය බෞද්ධ විශ්වවිද්‍යාල හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - මහල් නවයකින් හා මන්දිර තුනකින් සමන්විත පුස්තකාලයක් පැවතුණි.
B - ශ්‍රාවකයාන බුදුසමයේ කේන්ද්‍රස්ථානය විය.
C - ආකාශ වස්තු පර්යේෂණාගාරයක් තිබුණි.
D - විශ්වවිද්‍යාලය මධ්‍යයේ 'විද්‍යාගෘහ' නමින් ප්‍රධාන දේශන ශාලාවක් විය.
E - පුස්තකාල අරමුදලක් පිහිටුවා තිබුණි.

ඉහත ප්‍රකාශ අතුරින් වික්‍රමශිලා විශ්වවිද්‍යාලය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය ඇතුළත් වරණය තෝරන්න.

(1) A (2) B (3) C (4) D (5) E

**36.** ප්‍රාග් බෞද්ධ යුගයේදී ලක්වැසියන් දෙවියන් පිළිබඳ විශේෂ ගෞරවාදරයක් දැක් වූ බවට සාධක හමු වේ. ඒ අනුව දඩයක්කරුවන්ට අධිපති දෙවියා ලෙස පූජනීයත්වයට පත්ව ඇත්තේ,

(1) කම්මාර දෙවියා ය. (2) ව්‍යාධ දෙවියා ය. (3) පුරදේව දෙවියා ය.
(4) උපුල්වන් දෙවියා ය. (5) සුමන දෙවියා ය.

**37.** 'ප්‍රාග් මහින්ද යුගයේදී ලක්දිව බෞද්ධයන් සිටින්නට ඇතැ'යි අනුමාන කළ හැකි සාක්ෂි වංශකථා සාහිත්‍යයෙන් සොයාගත හැකි ය. මහින්දාගමනයට ආසන්නතම යුගයේදී එවැනි පිරිසක් සිටි බවට දැක්විය හැකි සාධකයක් වන්නේ,

(1) බුදුරජාණන් වහන්සේගේ ලංකාගමනයේදී විශාල පිරිසක් බෞද්ධයන් වී සිටීමයි.

(2) භද්දකච්චානා කුමරියගේ සම්ප්‍රාප්තියයි.

(3) මහාසුමන දෙවියන් ඇතුළු විශාල පිරිසක් බෞද්ධයන් වී සිටීමයි.

(4) ගිරිභඬු සෑය බෞද්ධයන් විසින් නිමවා තිබීමයි.

(5) මණිඅක්ඛික නාරජු ඇතුළු පිරිස බුදුසමය වැළඳ ගැනීමයි.

**38.** පහත දැක්වෙන ප්‍රකාශ හොඳින් කියවන්න.

A - පඤ්චශීල ප්‍රතිපදාවට අනුගත ව රාජ්‍ය පාලනය කළ ආමණ්ඩගාමිණී රජතුමා මාඝාත ආඥාව පැනවූයේ ය.

B - සතර සංග්‍රහ වස්තු අනුගමනය කරමින් සතර අගතියෙන් තොර ව රාජ්‍යය පාලනය කළ බුද්ධදාස රජතුමා සතුන්ට පවා වෙදකම් කොට සුවපත් කෙළේ ය.

C - අවිහිංසා ප්‍රතිපදාව අනුගමනය කළ සිරිසඟබෝ රජතුමා මරණ දණ්ඩනයට නියමවූවන්ට පවා අභය දානය දුන්නේ ය.

D - බෞද්ධ රාජ්‍ය පාලන මූලධර්ම අනුව රාජ්‍ය පාලනය කළ වළගම්බා රජතුමා ශාසන ශෝධනයක් සිදුකොට කතිකාවතක් පිහිටුවී ය.

E - සතර සංග්‍රහ වස්තු අනුගමනය කළ සද්ධාතිස්ස රජතුමා අනුන්ගේ කුඹුරක කුලියට වැඩකොට උපයාගත් ධනයෙන් මහා සංඝයාට දන් පූජා කෙළේ ය.

ඉහත ප්‍රකාශ අතුරින් **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) A (2) B (3) C (4) D (5) E

**39.** මහසෙන් රජතුමා ලාංකික බුදුසමයේ සංවර්ධනය වෙනුවෙන් කටයුතු කළ බවට සාධකයක් ලෙස හඳුනාගත හැක්කේ,

(1) ජේතවන විහාරය ඉදිකොට භික්ෂූන්ට පූජා කිරීමෙනි.
(2) විනය සංගායනාවක් පවත්වා ශාසන චිරස්ථිතිය ඇති කිරීමෙනි.
(3) ශාසන විරෝධී භික්ෂූන් හැටදෙනෙකු තෝරා වෙර ලකුණු තබා රටින් පිටුවහල් කිරීමෙනි.
(4) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට අනුග්‍රහය දැක්වීමෙනි.
(5) රටපුරා දන්සල් විවෘත කොට භික්ෂු සංඝයාට දන්දීමෙනි.

**40.** පහතින් දැක්වෙන්නේ මහාවිහාරය හා අභයගිරිය යන ආයතන දෙක සම්බන්ධ ප්‍රකාශ කිහිපයකි.

A - පාලි අටුවාකරණය සඳහා බුද්ධඝෝෂ හිමියන්ට පහසුකම් සැලසීම

B - විනය සංගායනාවක් පැවැත්වීම

C - දළදා වහන්සේ පිළිගෙන පුද පූජා හා පෙරහැර පැවැත්වීම

D - ලෝවා මහා ප්‍රාසාදය ශාසනික විනයකර්ම සඳහා භාවිත කිරීම

E - රත්න ප්‍රාසාදය මහානාග තෙරුන්ට පූජා කිරීම

ඉහත ප්‍රකාශ අතුරින් අභයගිරි සම්ප්‍රදායට අයත් ප්‍රකාශ දෙක ඇතුළත් වරණය තෝරන්න.

(1) A සහ B (2) A සහ C (3) B සහ D (4) C සහ D (5) C සහ E

**41.** ක්‍රි.ව. 11වන සියවසේ ථෙරවාද බුදුසමය බුරුම දේශයේ ස්ථාපනය වනවිට එහි රාජ්‍ය පාලනය කරන ලද්දේ ........................ විසිනි.

(1) කෙයංසිත්ථ රජතුමා (2) අනුරුද්ධ රජතුමා (3) නරපතිසිථු රජතුමා
(4) ධම්මචේතිය රජතුමා (5) මින් දොන් මින් රජතුමා

**42.** ප්‍රාග් බෞද්ධ චීන ජන ජීවිතය හැඩ ගැස් වූ ප්‍රධාන ආගමික සම්ප්‍රදාය දෙකක් පිළිබඳ තොරතුරු දැකගත හැකි ය. එම ආගමික සම්ප්‍රදාය දෙක වන්නේ,

(1) ෂින්තෝ සහ තාඕ දහමයි.
(2) කොන්ෆියුසියස් සහ ෂින්තෝ දහමයි.
(3) තාඕ සහ සෙන් දහමයි.
(4) ෂින්තෝ සහ සෙන් දහමයි.
(5) තාඕ සහ කොන්ෆියුසියස් දහමයි.

**43.** පහත සඳහන් ප්‍රකාශ අතුරින් ජපන් බුදුසමයට අදාළ ව **නො ගැළපෙන** ප්‍රකාශය තෝරන්න.

(1) බොන් යනු මළවුන් පිදීමේ උත්සවයකි.
(2) ජෝදෝ යනු බුදුරදුන්ගේ බුද්ධත්වය සිහිකරන උත්සවයකි.
(3) හනමත්සුරි යනු බුදුරදුන්ගේ පරිනිර්වාණය සිහිකරන උත්සවයකි.
(4) සුමිඑ යනු ජපන් සෙන් චිත්‍ර කලාවකි.
(5) ඉකෙබන යනු සෙන් බුදුදහමේ ආභාසයෙන් ඇති වූ මල් කලාවකි.

**44.** ජපානයට බුදුසමය සම්ප්‍රාප්ත වූ විට එරට පරිපාලනයට සම්බන්ධ වී සිටි සොගා වංශිකයන් බුදුසමය මහත් හරසරින් පිළිගත් අතර, මොනොනොබෙ සහ නකතොමි වංශිකයෝ බුදුසමයට එරෙහි වූහ. ඔවුහු බුදුසමය ජපානයේ ස්ථාවර වීම වැළැක්වීම සඳහා නොයෙක් උපක්‍රම යෙදූහ. කාලය ගෙවී යත් ම පළමුවරට ජපානය තුළ බුදුසමය පිළිබඳ ධනාත්මක ආකල්පයක් වර්ධනය විය. ඊට හේතු වූ කරුණ වූයේ,

(1) මොනොනොබෙ සහ නකතොමි වංශිකයන් ද බුදුසමය වැළඳ ගැනීමයි.
(2) බුදුසමයට හිරිහැර කිරීම හේතුවෙන් සමාජය තුළ වසංගත පැතිර යාමයි.
(3) බුදුසමය හේතුවෙන් මළවුන් කෙරෙහි වූ බිය පහව යාමයි.
(4) 'බුදුසමයට හිරිහැර කිරීමෙන් පැතිර ගිය වසංගතය උත්සන්න වී යැ'යි අදහසක් සමාජගත වීමයි.
(5) 'බුදුසමයට ජපන් සංස්කෘතිය දියුණු කළ හැකි යැ'යි ජපන් සමාජයෙහි විශ්වාසයක් ගොඩනැගීමයි.

**45.** බුද්ධ ප්‍රතිමාවක් නෙළීම පිණිස බුදුරදුන් ධරමාන කාලයේ ම අනේපිඬු සිටුතුමා විසින් අවසර ලබාගත් බව සඳහන් වන මූලාශ්‍රය වන්නේ,

(1) සමන්තපාසාදිකාවයි. (2) කාලිංගබෝධි ජාතකයයි. (3) මනෝරථපූරණියයි.
(4) චුල්ලවග්ගපාළියයි. (5) කෝසලබිම්බවර්ණනාවයි.

**46.** පොළොන්නරු ගල්විහාරයෙහි ඇති හිඳි පිළිමය පිළිබඳ අදහස් දක්වන ආචාර්ය ආනන්ද කුමාරස්වාමි එහි ආසනය ........................... යනුවෙන් හඳුන්වයි.

(1) පද්මාසනය (2) වීරාසනය (3) භද්‍රාසනය (4) වජ්‍රාසනය (5) ස්වස්තික ආසනය

**47.** 'බුදු, පසේබුදු, මහරහත් සහ සක්විතිරජු යන ථූපාරහ පුද්ගලයින් සඳහා ස්තූප නිර්මාණය කළ යුතු යැ'යි බුදුරදුන් අනුදැන වදාළ දේශනාව ඇතුළත් වන්නේ,

(1) මහාපරිනිබ්බාණ සූත්‍රයේ ය. (2) මහාපදාන සූත්‍රයේ ය.
(3) ලක්ඛණ සූත්‍රයේ ය. (4) පබ්බජ්ජා සූත්‍රයේ ය.
(5) මහානිදාන සූත්‍රයේ ය.

**48.** සඳකඩපහණ සහ එහි ඇති කැටයම් පිළිබඳ විවිධ විද්වතුන් මත පළ කර තිබේ. ඒ අනුව 'සඳකඩපහණ ගොඩනැගිලි දොරටු සැරසීමට යොදාගත් උපායක් හා පාදෝනියක් ලෙස දැක්විය හැකි ය.' යන අදහස ඉදිරිපත් කරන ලද්දේ,

(1) සෙනරත් පරණවිතාන විසිනි. (2) එච්. සී. පී. බෙල් විසිනි.
(3) ඩී. ටී. දේවේන්ද්‍ර විසිනි. (4) විනී විතාරණ විසිනි.
(5) විලියම් ඊ. වෝඩ් විසිනි.

**49.** ආමිස හා ප්‍රතිපත්ති යන පූජාවන්ගෙන් පුදසත්කාර ලැබීමට බුදුරදුන් සුදුසු වනබව විස්තර කරමින් රචිත කෘතිය පූජාවලියයි. එම ග්‍රන්ථයේ කතුවරයා වන්නේ,

(1) බුද්ධපුත්‍ර හිමියන් ය. (2) විද්‍යාචක්‍රවර්ති ය.
(3) දෙවන පරාක්‍රමබාහු රජු ය. (4) ධර්මසේන හිමියන් ය.
(5) ගුරුළුගෝමි පඬිතුමා ය.

**50.** බෞද්ධ සිතුවම් කලාවට අදාළ ව පහත දක්වා ඇති ප්‍රකාශ අවධානයෙන් කියවන්න.

A - බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නය පිළිබඳ ශ්‍රද්ධාව හා භක්තිය ඇති කිරීම
B - සමාජයට දහම් පණිවුඩයක් ලබාදීම
C - සමාජයට උපදේශයක් ලබාදීම
D - අකුරු නො දත් ගැමි ජනතාවට බණකතා කියා දී සිතුවම් මගින් ඒවා අවබෝධ කර ගැනීමට සැලැස්වීම
E - ශාසනික හා ඓතිහාසික වශයෙන් වැදගත් පුවත් පිළිබඳ අවබෝධයක් ලබාදීම

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් බෞද්ධ සිතුවම් කලාවෙන් අපේක්ෂිත අරමුණු වැඩි ම ගණනක් ඇතුළත් වරණය තෝරන්න.

(1) A (2) A සහ B
(3) A, B සහ C (4) A, B, C සහ D
(5) A, B, C, D සහ E යන සියල්ල ම

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

බෞද්ධ ශිෂ්ටාචාරය II
பௌத்த நாகரிகம் II
Buddhist Civilization II

45 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

✳ **I කොටසින්** ප්‍රශ්න **දෙකක්** ද, **II කොටසින්** ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) බ්‍රාහ්මණ ඉගැන්වීම්වල දැක්වෙන චතුර්විධ ආශ්‍රම ධර්ම නම් කරන්න. (ලකුණු 02යි.)

(ii) චතුර්විධ ආශ්‍රම ධර්මයන්ගේ පළමුවැන්න හඳුන්වා දෙන්න. (ලකුණු 03යි.)

(iii) බුදුරජාණන් වහන්සේ සහ වජ්ජි රාජ්‍යය අතර පැවති සබඳතා සාධක **තුනක්** මගින් පැහැදිලි කරන්න. (ලකුණු 04යි.)

(iv) සංජය බෙල්ලට්ඨිපුත්තගේ අමරාවික්ඛේපවාදය පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් කරන්න. (ලකුණු 05යි.)

(v) මානව වර්ගයාගේ ඒකත්වය බෞද්ධ ඉගැන්වීම් මගින් තහවුරු කොට ඇති ආකාරය ප්‍රමාණවත් සාධක ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06යි.)

**2.** (i) බුදුරජාණන් වහන්සේගේ සම්මාසම්බුද්ධ ගුණය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02යි.)

(ii) නකුලමාතා චරිතයෙන් වර්තමාන සමාජයට ලබාගත හැකි ආදර්ශ **තුනක්** සැකෙවින් දක්වන්න. (ලකුණු 03යි.)

(iii) බෞද්ධ ආර්ථික දර්ශනයෙහි එන සමජීවිකතාව ප්‍රමාණවත් ව පැහැදිලි කරන්න. (ලකුණු 04යි.)

(iv) චතුර්විධ සුඛය නම් කොට එහි පළමුවැන්න විස්තර කරන්න. (ලකුණු 05යි.)

(v) බුදුරදුන් ප්‍රකට කළ ආගමික සහනශීලී ගුණය වර්තමාන ආගමික ගැටුම් නිරාකරණයෙහිලා ආදර්ශ කොට ගත හැකි අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06යි.)

**3.** (i) "යෝ බාලෝ මඤ්ඤති බාල්‍යං" යන ධම්මපද ගාථාව නිවැරදි ව සම්පූර්ණ කරන්න. (ලකුණු 02යි.)

(ii) ඉහත 3 (i) හි සඳහන් ගාථාවේ අර්ථය නිවැරදි ව ලියා දක්වන්න. (ලකුණු 03යි.)

(iii) සිගාලෝවාද සූත්‍රයට අනුව කුලපුත්‍රයා විසින් මිතුරන්ටත්, මිතුරන් විසින් කුලපුත්‍රයාටත් ඉටුකළ යුතු යුතුකම් හා වගකීම් **දහය** නම් කරන්න. (ලකුණු 04යි.)

(iv) පාපමිත්‍ර සේවනය පුද්ගල ජීවිතයේ පරිහානියට හේතුවන අයුරු බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05යි.)

(v) "මවුපියන්ට උපස්ථාන කිරීම මංගල කරුණක් ලෙස මංගල සූත්‍රය අවධාරණය කරයි."
වර්තමාන සමාජ තත්ත්වයට සාපේක්ෂ ව ඉහත ප්‍රකාශයෙහි වැදගත්කම අවධාරණය කරන්න. (ලකුණු 06යි.)

[ දෙවැනි පිටුව බලන්න.

## II කොටස

**4.** (i) "ධන පරිභෝජනය පිළිබඳ බෞද්ධ ආකල්පය සමාජ සහජීවනයට මග පාදයි." ප්‍රමාණවත් සාධක මගින් සනාථ කරන්න. (ලකුණු 10යි.)

(ii) මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව කෙටියෙන් දක්වා මත් උවදුර පිටුදැකීමට බෞද්ධ ඉගැන්වීම්වලින් ලබාගත හැකි පිටිවහල ප්‍රමාණ කරන්න. (ලකුණු 10යි.)

**5.** (i) ත්‍රිවිධ ධර්ම සංගායනා සඳහා නායකත්වය දුන් මහතෙරවරුන්ගේ සේවය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 10යි.)

(ii) බුදුසසුනේ චිරස්ථිතිය උදෙසා පවත්වන ලද ධර්ම සංගායනා විෂයයෙහි භාරතීය රජවරුන්ගෙන් ලද අනුග්‍රහය ප්‍රමාණ කරන්න. (ලකුණු 10යි.)

**6.** (i) ජපන් සංස්කෘතියේ පෝෂණයට බුදුසමයෙන් ලද ආභාසය නිදසුන් සහිත ව ඉදිරිපත් කරන්න. (ලකුණු 10යි.)

(ii) චීන බුදුසමයේ සංවර්ධනය සඳහා ඉන්දු-චීන භික්ෂූන්ගෙන් ඉටු වූ මෙහෙය අගයන්න. (ලකුණු 10යි.)

**7.** (i) ශ්‍රී ලාංකේය ජනකවි හා ගීත කලාවේ පෝෂණයට බෞද්ධ ඉගැන්වීම්වලින් ලද ආභාසය විමර්ශනය කරන්න. (ලකුණු 10යි.)

(ii) අනුරාධපුර මහාවිහාරය ථෙරවාද බුදුසමයේ කේන්ද්‍රස්ථානය වූ බව ප්‍රමාණවත් සාධක මගින් සනාථ කරන්න. (ලකුණු 10යි.)

**8.** (i) බුද්ධ ප්‍රතිමා නිර්මාණයට පෙර බුදුරදුන් වෙනුවට භාවිත කරන ලද සංකේත ගෙනහැර දක්වා, බුද්ධ ප්‍රතිමා කලාවේ ආරම්භය පිළිබඳ ප්‍රමාණවත් සාකච්ඡාවක් කරන්න. (ලකුණු 10යි.)

(ii) පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකකට** ප්‍රමාණවත් විස්තර සපයන්න.

(1) බුද්ධ ප්‍රතිමාවේ ආසන

(2) වටදාගෙය

(3) සතර සංග්‍රහ වස්තු

(4) නාලන්දා විශ්වවිද්‍යාලය (ලකුණු 05× 2 = 10යි.)

* * *


සියලු ම හිමිකම් ඇවිරිණි. | රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2024

# 45 - බෞද්ධ ශිෂ්ටාචාරය

ලකුණු දීමේ පටිපාටිය



අභිමානවත් මහා ශිෂ්ටාචාරයක අතීත උරුමයන් - නාලන්දා විශ්වවිද්‍යාලය
(ක්‍රි.ව. 5වන සියවස - 13වන සියවස)

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2024

## 45 - බෞද්ධ ශිෂ්ටාචාරය

**ප්‍රශ්නපත්‍ර ව්‍යුහය**

**I පත්‍රය-** කාලය - පැය 02 යි.

වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 50 කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 50 කි.

**II පත්‍රය-** කාලය - පැය 03 යි.

මෙම ප්‍රශ්නපත්‍රය I හා II වශයෙන් කොටස් දෙකකින් සමන්විත ය.

**I කොටස** - ව්‍යුහගත ප්‍රශ්න තුනකි. ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සැපයිය යුතුය. ප්‍රශ්නයක කොටස් පහකි. (I) කොටසට ලකුණු 02 කි. (II) කොටසට ලකුණු 03 කි. (III) කොටසට ලකුණු 04 කි. (IV) කොටසට ලකුණු 05 කි. (V) කොටසට ලකුණු 06 කි. එකතුව ලකුණු 20 කි.

**II කොටස** - රචනා වර්ගයේ ප්‍රශ්න පහකි. ප්‍රශ්න තුනකට පිළිතුරු සැපයිය යුතුය. ප්‍රශ්නයක කොටස් දෙකකි. එක් කොටසකට ලකුණු 10 බැගින් ලකුණු 20 ක් හිමි වේ.

**II පත්‍රය සඳහා මුළු ලකුණු** = 100

**අවසාන ලකුණු ගණනය කිරීම** : **I පත්‍රය** = 100

**II පත්‍රය** = 100

**අවසාන ලකුණ** = 200 ÷ 2 = 100

# **උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම**

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ..........................................................
..........................................................
..........................................................  √  △ $\frac{4}{5}$

(ii) ..........................................................
..........................................................  √
..........................................................  △ $\frac{3}{5}$

(iii) ..........................................................
..........................................................  √
..........................................................  △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මඟින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස.(උ.පෙළ) විභාගය/க.பொ.த. (உயர் தர)ப் பரீட்சை- 2024

විෂයය අංකය / பாட இலக்கம் **45**

විෂයය / பாடம் **බෞද්ධ ශිෂ්ටාචාරය**

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | නිවැරදි පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | නිවැරදි පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | නිවැරදි පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | නිවැරදි පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | නිවැරදි පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 5 | 21. | 2 | 31. | 1 | 41. | 2 |
| 02. | 1 | 12. | 4 | 22. | 4 | 32. | 4 | 42. | 5 |
| 03. | 2 | 13. | 1 | 23. | 1 | 33. | 3 | 43. | 3 |
| 04. | 3 | 14. | 1 | 24. | 1 | 34. | 3 | 44. | 4 |
| 05. | 4 | 15. | 5 | 25. | 5 | 35. | 4 | 45. | 2 |
| 06. | 3 | 16. | 3 | 26. | 2/4 | 36. | 2 | 46. | 4 |
| 07. | 5 | 17. | 5 | 27. | 3 | 37. | 2 | 47. | 1 |
| 08. | 3 | 18. | 2 | 28. | 3 | 38. | 4 | 48. | 3 |
| 09. | 2 | 19. | 5 | 29. | 2 | 39. | 1 | 49. | 1 |
| 10. | 1 | 20. | 2 | 30. | 5 | 40 | 5 | 50 | 5 |

✪විශේෂ උපදෙස්/விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ஒரு சரியான விடைக்கு ලකුණු 01 බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 50 = 50

# 45 - බෞද්ධ ශිෂ්ටාචාරය

## II පත්‍රය

01.(i) **බ්‍රාහ්මණ ඉගැන්වීම්වල දැක්වෙන චතුර්විධ ආශ්‍රම ධර්ම නම් කරන්න.**

1. බ්‍රහ්මචාරී ආශ්‍රමය
2. ගෘහස්ථ ආශ්‍රමය
3. වානප්‍රස්ථ ආශ්‍රමය
4. සන්‍යාසි ආශ්‍රමය

**(ලකුණු 02)**

01. (ii) **චතුර්විධ ආශ්‍රම ධර්මයන්ගේ පළමුවැන්න හඳුන්වා දෙන්න.**

- උපතේ සිට ගෘහස්ථ ජීවිතයකට අවතීර්ණ වන තෙක් කාල පරිච්ඡේදය බ්‍රහ්මචාරී ආශ්‍රමයට අයත් ය.
- මෙම ආශ්‍රමයේදී සිදු කළයුතු ප්‍රධානතම කාර්යය වන්නේ බ්‍රහ්මචාරීව සිටිමින් ශිල්ප ශාස්ත්‍ර ඉගෙනීමයි.
- ආර්ය කුලයක දරුවන් අධ්‍යාපනය සඳහා යොමු කරනු ලබන්නේ උපනයනයෙන් පසුවය.
- මෙම උපනයන කර්මය බ්‍රාහ්මණ වංශික දරුවන් සඳහා අවුරුදු 08 දී ද ක්ෂත්‍රිය වංශික දරුවන් සඳහා අවුරුදු 11 දී ද වෛශ්‍ය වංශික දරුවන් සඳහා අවුරුදු 12 දී ද සිදු කරයි.
- උපනයනයෙන් පසු වේදයෙහි පාරප්‍රාප්ත වූ බ්‍රාහ්මණ ආචාර්යවරයෙකු වෙත එළඹ නේවාසිකව අධ්‍යාපනය ලැබිය යුතු ය.
- වේද අධ්‍යයනය අනිවාර්ය විය.
- මීට අමතරව වේදාංග අධ්‍යයනය ද කළයුතු විය.
- බ්‍රාහ්මණ වංශික දරුවන්ට අධ්‍යාපනික හා පූජක කාර්යයට අදාළ වේද වේදාංග හා ශිල්ප ශාස්ත්‍ර පිළිබඳව අධ්‍යාපනයක් ලබා දී ඇත.
- ක්ෂත්‍රිය හා වෛශ්‍ය කුලයන්හි දරුවන්ට ඔවුන්ගේ වෘත්තීන්ට අවශ්‍ය අධ්‍යාපනයක් මෙම ආශ්‍රමයේදී ලබා දී ඇත.

**(ලකුණු 03)**

01. (iii) **බුදුරජාණන් වහන්සේ සහ වජ්ජි රාජ්‍යය අතර පැවති සබඳතා සාධක තුනක් මගින් පැහැදිලි කරන්න.**

- විශාලා මහනුවර තුන් බිය දුරු කිරීම සඳහා රතන සූත්‍රය දේශනා කිරීම.
- බුදුරජාණන් වහන්සේ පස්වන වස් කාලය විශාලා මහනුවර කූටාගාර ශාලාවෙහි වැඩ සිටීම.
- අෂ්ට ගරු ධර්ම පිළිගැනීමෙන් පසු මහා ප්‍රජාපතී ගෝතමියට විශාලා මහනුවර කූටාගාර ශාලාවේදී පැවිදි උපසම්පදාව ලබා දී භික්ෂුණී ශාසනය ආරම්භ කිරීම.
- වජ්ජි රාජ්‍යයේ පාලන මූලධර්මය ලෙස අනුගමනය කළ සප්ත අපරිහානීය ධර්ම අනුමත කරමින් වජ්ජීන්ගේ සමූහාණ්ඩු පාලන ක්‍රමය බුදුරදුන්ගේ ඇගයීමට ලක් වීම.
- බුදුන් වහන්සේ අවසන් වස් කාලය වජ්ජි ජනපදයේ බේලුව නම් ගමේ ගත කිරීම.
- වජ්ජි රාජ්‍යයේ පිහිටි රමණීය ස්ථාන බුදුරදුන්ගේ වර්ණනාවට ලක්වීම. '' රමණීයං ආනන්ද වේසාලියං...''(උදේන, ගෝතමක, සත්තම්බක, බහුපුත්තක, සාරන්දද, චාපාල, යන චෛත්‍යස්ථාන ඇගයීමට ලක් කිරීම.
- බුදුන් වහන්සේ විශාලාවේ පිහිටි චාපාල චෛත්‍යස්ථානයේදී ආයු සංස්කාරය අත් හැරීම.
- වජ්ජි රාජ්‍යයෙහි කූටාගාර ශාලාවට ආනන්ද හිමියන් මගින් භික්ෂූන් වහන්සේ රැස් කරවා තමන් වහන්සේ තුන් මසකින් පිරිනිවන් පානා බව දැනුම් දීම.
- විශාලාවට අයත් අම්බපාලි අඹ උයන පිළිගැනීම හා එහි විවේක සුවයෙන් වැඩ සිටීම.
- බුදු සිරුර ආදාහනයෙන් අනතුරුව වජ්ජීන් වෙනුවෙන් ද ශාරීරික ධාතු වෙන් කිරීම හා වජ්ජි රජවරුන් ධාතු පිළිගෙන චෛත්‍යයක් ඉදි කිරීම.

**(ලකුණු 04)**

01. (iv) **සංජය බෙල්ලට්ඨිපුත්තගේ අමරාවික්ඛේපවාදය පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් කරන්න.**

- සංජය බෙල්ලට්ඨිපුත්තගේ ඉගැන්වීම සංශයවාදය/ අමරාවික්ඛේපවාදය නමින් හැඳින්වෙයි.
- දී.නි. බ්‍රහ්මජාල සූත්‍රයේ සඳහන් පංච නිශේධන ක්‍රමය තුළින් අමරාවික්ඛේපවාදය ප්‍රකට වෙයි.
  1. **ඒවන්තිපි මේ නෝ** - මේ කාරණය මෙසේ යැයි මට අදහසක් නැත
  2. **තථා තිපි මේ නෝ** - මේ කාරණය එසේ යැයි ද මට අදහසක් නැත
  3. **අඤ්ඤථා තිපි මේ නෝ** - මේ කාරණය වෙන සැටියකින් යැයි ද මට අදහසක් නැත.
  4. **නෝ තිපි මේ නෝ** - මේ කාරණය නැතැයි ද මට අදහසක් නැත
  5. **නෝ නෝ තිපි මේ නෝ** - මේ කාරණය නැත්තේ නැතැයි ද මට අදහසක් නැත
- දී. නි. සාමඤ්ඤඵල සූත්‍රයේ සඳහන් වන පරිදි මොහුගේ ඉගැන්වීම පහත සඳහන් පරිදි ය.
- "පරලොවක් ඇත්තේ දැයි මගෙන් විචාරයි නම් පරලොවක් ඇතැයි මට අදහසක් වී නම් පරලොවක් ඇතැයි මම කියමි. එහෙත් මෙසේ වූ අදහසක් මට නොමැත. පරලොවක් ඇතැයි යන එබඳු වූ අදහසක් ද මට නොමැත. අන් පරිද්දකින් වූ අදහසක් ද මට නොමැත. පරලොවක් ඇත්තේ නොවේ කියා මට අදහසක් නොමැත. පරලොවක් නොමැත්තේ නොවේ කියා අදහසක් ද මට නොමැත."
- මේ විස්තරයට අනුව කිසිදු නිශ්චිත නිගමනයකට නො එළඹෙමින් ප්‍රශ්න මග හැර සැක මුසුව පිළිතුරු දීම මොහුගේ ඉගැන්වීම්වල ස්වභාවයයි.
- දී.නි. බ්‍රහ්මජාල සූත්‍රයේ දැක්වෙන ආකාරයට අමරාවික්ඛේපවාදියා ප්‍රශ්න ඉදිරියේ වාග් වික්ෂිප්තතාවට හෙවත් වචන පටලවා කථා කිරීමට යොමු වෙයි. වාග් වික්ෂිප්තතාව ආකාර හතරකි.
  1. **මුසාවාද භයා මුසාවාද පරිජේගුච්ඡා** - තමා බොරු කීමේ පාපයට අසු වෙතැයි බියෙන් ස්ථිර පිළිතුරැක් නොදීම. යම් කෙනෙක් මේවා කුසල් දැයි ඇසුවහොත් තමාගේ පිළිතුරු වැරදි විය හැකි ය, යන භය නිසා මට එසේ නොසිතේ යැයි කීම. කුසල් නොවේ දැයි ඇසූ විට ද එසේ පිළිතුරු දීම

2. **උපාදාන භයා උපාදාන පරිජේගුච්ඡා** - යම් අයුරකින් කුසල් අකුසල් පිළිබඳ නියම ලෙස නො දන්නා නිසා දැඩි කොට ගැනීම මගින් තමන්ට අහිත පිණිස පැවතිය හැකි යැයි, බොරු කියවිය හැකි යැයි සිතා එකකටවත් හසු නො වන සේ සැක මුසු පිළිතුරු දීම.
3. **අනුයෝග භයා අනුයෝග පරිජේගුච්ඡා** - මා ප්‍රකාශ කරන දේ නිසා මතවාද මර්දනයේ දක්ෂ බුද්ධිමතෙකුගේ අභියෝගයකට මුහුණ දිය හැකි ය. එහිදී පිළිතුරු දිය නොහැකි වුවහොත් මට නින්දා පිණිස කරුණු යෙදේ යැයි සලකා එසේත් නො වේ. මෙසේ නොවන්නේත් නො වේ. යනුවෙන් සැකමුසු පිළිතුරු දීම.
4. **මන්දත්තා මොමූහත්තා** - අඥානකම නිසාම පිළිතුරු දීමට නො හැකි ව ඇසූ ඇසූ ප්‍රශ්න ඉහත කී පරිදිම මග හැර යාම. ඍජු පිළිතුරු නො දීම.

**(ලකුණු 05)**

01. (v) **මානව වර්ගයාගේ ඒකත්වය බෞද්ධ ඉගැන්වීම් මගින් තහවුරු කොට ඇති ආකාරය ප්‍රමාණවත් සාධක ඇසුරෙන් පැහැදිලි කරන්න.**

- මානව වර්ගයාගේ ඒකත්වය ඓතිහාසික, ජීව විද්‍යාත්මක, සමාජ විද්‍යාත්මක, ආචාර විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක ආදී සාධක තුළින් බුදුසමය තහවුරු කොට ඇති බව.
- සමාජ සංස්ථාවන්ගේ ප්‍රභවය හා විකාශය ඓතිහාසික ව පටිච්චසමුප්පාද සිද්ධාන්තයට අනුව පරිණාමය වූවක් බව දී.නි. අග්ගඤ්ඤ සූත්‍රයෙහි සඳහන් වීම.
- බමුණන් අතිමානයෙන් සැලකූ කුල පාරිශුද්ධිය මිථ්‍යා විශ්වාසයක් බව දී.නි. අම්බට්ඨ සූත්‍රයේදී ඓතිහාසික සාධක මගින් පැහැදිලි කිරීම.
- දී.නි. වාසෙට්ඨ සූත්‍රයේදී බුදුන් වහන්සේ ජීව විද්‍යාත්මක කරුණු ඉදිරිපත් කරමින් මානව වර්ගයාගේ ඒකත්වය තහවුරු කර තිබීම.

  යථා ඒතාසු ජාතීසු - ලිංගං ජාතිමයං පුථු

  එවං නත්ථි මනුස්සේසු - ලිංගං ජාතිමයං පුථු

- අස්සලායන බමුණා විසින් බුදුරදුන් හමුවේ බමුණන්ගේ ශ්‍රේෂ්ඨත්වය පාරිශුද්ධිය වර්ණනා කරන ලද අවස්ථාවේදී අනෙක් මිනිසුන්ගේ උපත සිදු වන ආකාරයට ම බමුණු ස්ත්‍රීන් ඍතු වීම, ගැබ් ගැනීම, දරුවන් බිහි කිරීම, කිරි පෙවීම ආදිය පෙනෙන්නට තිබියදී ම බමුණන් මහා බ්‍රහ්මයාගේ මුඛයෙන් උපන් බව පැවසීම අර්ථශූන්‍ය යැයි ම.නි. අස්සලායන සූත්‍රයේදී ජීව විද්‍යාත්මකව පෙන්වා දීම.

- ම. නි. අස්සලායන සූත්‍රයේ යෝන කාම්බෝජ ආදි ඇතැම් ප්‍රදේශයන්හි ආර්යයන් දාසයන් වන බවත් දාසයන් ආර්යයන් වන බවත් සමාජ විද්‍යාත්මකව පෙන්වා තිබීම.
- සුත්තනිපාතයේ වසල සූත්‍රයේදී පුද්ගලයකු වසලයකු හෝ බ්‍රාහ්මණයකු බවට පත් වන්නේ ඔහුගේ ක්‍රියාවෙන් මිස උපතින් නොවන බව ආචාර විද්‍යාත්මක සාධක මගින් පෙන්වා දීම.
- ම.නි. මධුර සූත්‍රයේදී මිනිසුන් අතර ජාති හෝ වර්ණ භේදය නොපැවතිය යුතු බව ආර්ථික හා සමාජ විද්‍යාත්මක පදනමකින් යුතුව දක්වා තිබීම.
- ම.නි. මධුර සූත්‍රයේදී වර්ණ භේදයකින් තොරව කර්මඵල විපාක සියල්ලන්ට ම එකසේ ලැබෙන බව මනෝවිද්‍යාත්මක පදනමකින් යුතුව පෙන්වා දීම.

**(ලකුණු 06)**

**02. (i) බුදුරජාණන් වහන්සේගේ සම්මාසම්බුද්ධ ගුණය කෙටියෙන් හඳුන්වන්න.**

- මැනවින් තමා ම අවබෝධ කළේ ය, අවබෝධ කරයි, අවබෝධ කරන්නේය, (සම්මා සයමෙව අබුජ්ඣි, බුජ්ඣති, බුජ්ඣිස්සතීති සම්මාසම්බුද්ධො) යන අරුතින් බුදුරජාණන් වහන්සේ සම්මාසම්බුද්ධ වන බව.
- දැන ගත යුතු සියලු ධර්ම දැන ගෙන අවබෝධ කළ බැවින් ද, සාක්ෂාත් කළ යුතු සියලු ධර්ම සාක්ෂාත් කළ බැවින් ද, වැඩිය යුතු සියලු ධර්ම වැඩූ බැවින් ද, ප්‍රහාණය කළ යුතු සියලු ධර්ම ප්‍රහාණය කළ බැවින් ද 'බුද්ධ' නම් වන බව හා ඒවා තමා විසින් ම සිදු කරන ලද බැවින් සම්මාසම්බුද්ධ වන බව.

තුන් කල්හි ම පැවති - පදරුත් සියල් ලොව ඇති
අතැඹුල සෙ දැන ගති - එයින් සම්මා සම්බුදුන යෙති

**(ලකුණු 02)**

**2. (ii) නකුලමාතා චරිතයෙන් වර්තමාන සමාජයට ලබාගත හැකි ආදර්ශ තුනක් සැකෙවින් දක්වන්න.**

- සමසද්ධා, සමසීල, සමචාග, සමපඤ්ඤා යන ගුණවලින් යුක්තව ආදර්ශවත් පවුල් ජීවිතයක් ගත කළ බව.
- පරමාදර්ශී බිරිඳක ලෙස පතිදම් සුරකිමින් සිය සැමියා හැර පර පුරුෂයකු සිතින් හෝ ප්‍රාර්ථනා නො කළ බව.
- සොළොස් වසරක් තිස්සේ ගෘහස්ථ බ්‍රහ්මචරියාව ආරක්ෂා කළ බව.
- සැමියා විසින් ආර්ථික දියුණුව සඳහා සිදු කරන ලද සියලු කර්මාන්ත සැමියාගේ වියෝවෙන් පසුව වුව ද නිසි පරිදි පවත්වා ගෙන යාමට හැකි අයුරින් පුහුණු වී සිටි බව.

- සැමියාගේ වියෝවෙන් පසුව දිවි ඇති තෙක් ගෘහස්ථ බ්‍රහ්මචරියාවෙන් කල් ගෙවීමට අධිෂ්ඨාන කර ගෙන සිටි බව.
- සැමියාගේ වියෝවෙන් පසු ව වුව ද දරුවන් රැක බලා ගනිමින් මනා කුටුම්භ සංරක්ෂණයකට අවශ්‍ය පසුබිම සකස් කර ගත් බව.
- තමා විසින් පවත්වා ගෙන ගිය ගුණ ධර්මවල ආශීර්වාදයෙන් හා මනාව උපස්ථාන කිරීමෙන් රෝගාතුරව මරණාසන්නව සිටි සැමියා සුවපත් කර ගැනීමට කටයුතු කළ බව.
- බුදුරදුන් හා මහා සංඝයා නිරන්තරයෙන් ඇසුරු කරමින් කුලූපග බෞද්ධ මහෝපාසිකාවක් වූ බව.
- නිති පන්සිල් සුරකිමින් බුද්ධ ප්‍රමුඛ සංඝයාට නිති දන්වැට පැවැත්වූ බව.
- සත්‍යවාදීවම කටයුතු කළ අතර ඇදහිය හැකි කතා ඇත්තවුන් අතර අගතනතුර ලැබූ බව.

**(ලකුණු 03)**

02. (iii) **බෞද්ධ ආර්ථික දර්ශනයෙහි එන සමජීවිකතාව ප්‍රමාණවත්ව පැහැදිලි කරන්න.**

- අංගුත්තර නිකායේ ඇතුළත් ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි පුද්ගලයෙකුගේ මෙලොව දියුණුව උදාකර ගැනීමට හේතුවන කරුණු හතරෙන් එකක් ලෙස සමජීවිකතාව වැදගත් වේ.
- එහි සරල අර්ථය වන්නේ කිසියම් පුද්ගලයෙක් තමන්ට ලැබෙන ආදායම පිළිබඳව සැලකිලිමත්ව වැය ගැන අවධානය යොමුකොට කටයුතු කිරීමයි.
- සමජීවිකතාව මෙම සූත්‍රයෙහි විග්‍රහකොට ඇත්තේ මෙසේය.
  "ව්‍යග්ඝපජ්ජය, මේ ලෝකයෙහි කුල පුත්‍රයෙක් භෝගයන්ගේ, වස්තූන්ගේ අය ද වැය ද දැන ඉතා වැඩිත් නො කොට අඩුත් නො කොට සමව දිවි ගෙවයි. මෙසේ මාගේ අය වැය, ඉක්මවා සිටී. මෙසේ මාගේ වැය, අය ඉක්මවා නො සිටී. "යනුවෙනි.

  "ව්‍යග්ඝපජ්ජය, යම් සේ තරාදියෙන් බඩු කිරන්නෙක් හෝ ඔහුගේ අතවැසියෙක් හෝ තරාදිය ගෙන මෙපමණ බරකින් පහත් වී යයි පෙනී, දැනගනී ද එසේම කුල පුත්‍රයා වස්තූන්ගේ අය ද වැය ද විමසා දැනගෙන ඉතා වැඩිත් නො කොට අඩුත් නො කොට මෙසේ වියදම් කිරීමෙන් මාගේ අය, වැය ඉක්මවා සිටී. වැය, අය ඉක්මවා නො සිටී යයි පමණ දැන වියදම් කිරීමෙන් සමව දිවි ගෙවයි."
- පුද්ගලයෙක් ධනය උපයා ගොඩ ගසාගෙන සිටින්නේ නම් ඔහු නොකා නොබී මිය යන්නෙකු බව අජද්ධුමාරික, යන්නෙන් ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දක්වෙන අතර

සමාජයට හානිකර විනාශකාරී අධිපරිභෝජනය උදුම්බරඛාදික යනුවෙන් දක්වා ඇති අතර එයින් ද වැළකීම බෞද්ධ පිළිවෙත බව

**(ලකුණු 04)**

**02. (iv) චතුර්විධ සුඛය නම්කොට එහි පළමුවැන්න විස්තර කරන්න.**

- අනණ සූත්‍රයෙහි ගිහියකු විසින් උපදවාගත යුතු සැප හතරක් පිළිබඳව විස්තර වේ.

  1. අත්ථි සුඛ
  2. භෝග සුඛ
  3. අනණ සුඛ
  4. අනවජ්ජ සුඛ යනුවෙන් දැක්වෙන්නේ එම චතුර්විධ සුඛයයි.

- මෙහි සඳහන් අත්ථි සුඛ යන්නෙන් අදහස් කෙරෙනුයේ උට්ඨාන වීර්යෙන්, බාහු බලයෙන්, දහදිය වගුරවමින් ධාර්මික ව උපයාගත් ධනයක් තමනට ඇතැයි සිතා සතුටුවීමයි. ඒ බව
- "උට්ඨානවිරියාධිගතා බාහාබලපරිචිතා සේදාවක්ඛිත්තා ධම්මිකා ධම්මලද්ධාති අධිගච්ඡති සුඛං ...... "යනුවෙන් විස්තර වේ.
- ඒ අනුව ධාර්මික ව උපයාගත් මිල මුදල්, ගේ දොර, ඉඩ කඩම්, යාන වාහන ආදී චංචල හා නිශ්චල දේපළ සියල්ල අත්ථි සුඛයට ඇතුළත් වේ.

**(ලකුණු 05)**

**02. (v) බුදුරදුන් ප්‍රකට කළ ආගමික සහනශීලී ගුණය වර්තමාන ආගමික ගැටුම් නිරාකරණයෙහිලා ආදර්ශ කොට ගත හැකි අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න.**

- බුදුරදුන් භාරතයේ පහළවනවිට විවිධ ආගමික මතවාද ඉදිරිපත් කළ ශාස්තෘවරුන් රැසක් වාසය කළ බවට තොරතුරු ත්‍රිපිටක සාහිත්‍යය තුළින් හඳුනාගත හැකිය.
- එම මතවාදයන් සමග බුදුරදුන් එකඟ නොවුණ ද එම මතවාද ඉදිරිපත් කළ ආගමිකයින් හා බුදුරදුන් අතර සමීප සබඳතාවක් පැවැති බවට නිදසුන් සූත්‍රපිටකය තුළින් අනාවරණය වේ.
- නිගණ්ඨනාතපුත්තගේ ප්‍රබල අනුගාමිකයෙකු වූ උපාලි ගෘහපති බුදුරදුන් සමග වාදයට යොමුව එයින් පැරදුන කල්හි බුදුරදුන් පිළිබඳව ප්‍රසාදයක් ඇති වී බුදුසසුනේ ශ්‍රාවකයෙකු වීමට අවස්ථාව ලබාදෙන ලෙස ඉල්ලීම් කළ විට ක්ෂණිකව

එවන් තීරණයකට නො එළඹ තවදුරටත් සිතා බලන ලෙසට දැනුම් දුණි. නමුත් නැවැත නැවැත ඔහු කළ ඉල්ලීමට බුදුරදුන් ප්‍රතිචාර දක්වමින් දේශනා කරනු ලැබුවේ තමන් බුදුසසුනේ ශ්‍රාවකයෙක් වුවත් පෙර ශාස්තෘවරයාට කළ පුදසත්කාර ඒ අයුරින්ම පවත්වාගන යන ලෙසයි.

- මේ ආකාරයටම සීහ සේනාපති බුදුරදුන් සමග සිදුකළ සංවාදයෙන් අනතුරුව අනුගාමිකයෙකු වීමට අවස්ථාව සලසා දෙන ලෙස කළ ඉල්ලීමට ද ප්‍රතිචාර දැක්වූයේ ඉහත ආකාරයටම ය.
- උදුම්බරිකසීහනාද සූත්‍රයෙහි දැක්වෙන පරිදි නිග්‍රෝධ පිරිවැජි සමග කළ සාකච්ඡාවේදී බුදුරදුන් විසින් ධර්ම කරුණු ඉදිරිපත් කරනු ලැබුවේ නිග්‍රෝධ තම ශ්‍රාවකයෙකු කරගැනීමේ අදහසින් නොවන බවයි.
- පොට්ඨපාද, චූලසකුළුදායි, මහාසකුළුදායි, වච්චගොත්ත වැනි පරිබ්‍රාජක අසපුවලට බුදුරදුන් වැඩම කළ අවස්ථාවේ තම අනුගාමිකයින් නිහඬ කරවා බුදුරදුන් වෙනුවෙන් අසුන් පනවා ගෞරවාන්විත ව බුදුරදුන් පිළිගෙන ඇත්තේ ඔවුන් බුදුරදුන් සමග සමීප ඇසුරක් පවත්වාගෙන ගිය බැවිණි. ප්‍රතිවිරුද්ධ මතවාද දරන පිරිස් සමග ගැටුමක් පැවතුණා නම් මෙවන් උණුසුම් පිළිගැනීමක් කිසිවිටකත් හිමි නො වනු ඇත.
- මහණ බමුණන්ට දන්දීම, මහණ බමුණන්ගෙන් උපදෙස් ලබා ගැනීම කළ යුතු බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වීමෙන් අනෙකුත් ආගමික පිරිස්වල වැදගත්කම අවධාරණය කර ඇත.
- මෙවන් කරුණු තුළින් වටිනා උපදේශයක් වත්මන් ආගමික පිරිස් සඳහා ලබා ගත හැකිය.
- වර්තමානයේ විවිධ ආගමික පිරිස් අතර තම මතවාදය හුවා දැක්වීමට යාමේදී විවිධ ගැටුම් නිර්මාණය වන බවක් දක්නට ලැබේ.
- එය නො විය යුත්තක් බවත්, තම මතවාදයන් තවත් ආගමක් හෝ දර්ශනයක් යටපත් කිරීම අරමුණු කරගෙන සිදු නො කිරීම තුළින් ආගමික සහජීවනයට අවස්ථාව උදාවන බව පැහැදිලි විය යුතුය.

**(ලකුණු 06)**

**03. (i) යො බාලො මඤ්ඤති බාල්‍යං යන ධම්මපද ගාථාව නිවැරදිව සම්පූර්ණ කරන්න.**

යො බාලෝ මඤ්ඤති බාල්‍යං - පණ්ඩිතෝ වාපි තේන සො

බාලෝ ච පණ්ඩිතමානි - ස වේ බාලෝති වුච්චති

**(ලකුණු 02)**

**03. (ii) ඉහත 3.1 හි සඳහන් ගාථාවේ අර්ථය නිවැරදිව ලියා දක්වන්න.**

යම් අනුවණ පුද්ගලයකුට තමාගේ මෝඩකම ගැන හැඟේ නම් ඒ කාරණයෙන් පවා ඔහු පණ්ඩිතයෙක් වේ. තමා පණ්ඩිතයෙකැයි සිතන මෝඩයා ඒකාන්තයෙන් ම මෝඩයෙක් යැයි කියනු ලැබේ.

**(ලකුණු 03)**

**03. (iii) සිගාලෝවාද සූත්‍රයට අනුව කුල පුත්‍රයා විසින් මිතුරන්ටත් මිතුරන් විසින් කුල පුත්‍රයාටත් ඉටුකළ යුතු යුතුකම් හා වගකීම් දහය නම් කරන්න.**

**කුල පුත්‍රයා විසින් මිතුරන්ට**

1. මිතුරාට අවශ්‍ය දේ ලබාදීම (දානේන)
2. ප්‍රිය වචනයෙන් කථා කිරීම (පෙය්‍යවජ්ජේන)
3. දියුණුව සඳහා කටයුතු කිරීම (අත්ථචරියාය)
4. සමානාත්මතාව දැක්වීම (සමානත්තතාය)
5. නො රැවටීම (අවිසංවාදනතාය)

**මිතුරන් විසින් කුලපුත්‍රයාට**

1. මත්වීම ආදියෙන් ප්‍රමාද වූ මිතුරා ආරක්ෂා කරයි. (පමත්තං රක්ඛන්ති)
2. පමා වූ මිතුරාගේ වස්තුව ආරක්ෂාකර දෙයි. (පමත්තස්ස සාපතෙය්‍යං රක්ඛන්ති)
3. බියට පත්වූ මිතුරා ඉන් මුදාගනියි. (භීතස්ස සරණං හොන්ති)
4. විපතට පත් මිතුරා අත් නොහරියි. (ආපදාසු න විජහන්ති)
5. මිතුරාගේ දරුමුණුබුරන්ට සළකයි. (අපරපජාචස්ස පටිපූජෙන්ති)

**(ලකුණු 04)**

**03. (iv) පාපමිත්‍ර සේවනය පුද්ගල ජීවිතයේ පරිහානියට හේතුවන අයුරු බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් පැහැදිලි කරන්න.**

- පාපයට පොළඹවන පුද්ගලයා පාප මිත්‍රයෙකු ලෙස හැඳින්වෙන බව.
- උපයාගන්නා භෝග සම්පත් විනාශයට හේතුවන භෝග විනාශ මුඛ හයක් සිගාලෝවාද සූත්‍රයේ දක්වා ඇති අතර පාප මිත්‍ර සේවනය ඉන් එකක් ලෙස දැක්වෙන බව.
- සිගාලෝවාද සූත්‍රයේදී පාප මිත්‍ර සේවනයේ ආදීනව හයක් දක්වා ඇති බව.
  1. සූදුකරුවෝ ඔහුගේ මිතුරෝ වෙති. (යේ ධුත්තා)
  2. ස්ත්‍රී ධූර්තයෝ ඔහුගේ මිතුරෝ වෙති. (යේ සොණ්ඩා)
  3. සුරා ලොල් වූවෝ ඔහුගේ මිතුරෝ වෙති. (යේ පිපාසා)
  4. කපටි පුද්ගලයෝ ඔහුගේ මිතුරෝ වෙති. (යේ නේකතිකා)

5. වංචනිකයෝ ඔහුගේ මිතුරෝ වෙති. (යේ වඤ්චනිකා)
6. සාහසිකයෝ ඔහුගේ මිතුරෝ වෙති. (යේ සාහසිකා)

- සිගාලෝවාද සූත්‍රයේ පාපමිත්‍රයන් හා කල්‍යාණ මිත්‍රයන් පිළිබඳව කර ඇති වර්ගීකරණයේදී පාප මිත්‍රයන් පිළිබඳව විවරණය කර ඇති බව

**අඤ්ඤදත්ථුහර මිත්‍රයාගේ ලක්ෂණ**

- නිතරම මිත්‍රයාගෙන් යමක් ලබාගැනීම සඳහා කටයුතු කරයි.
- සුළු උපකාරයක් කොට විශාල ප්‍රතිඋපකාරයක් අපේක්ෂා කරයි.
- මිතුරා විපතට පත්වන ලෙස ක්‍රියා කරයි.
- ආත්මාර්ථය උදෙසා ම කටයුතු කරයි.

**වචීපරම මිත්‍රයාගේ ලක්ෂණ**

- අතීතයෙන් සංග්‍රහ කරයි
- අනාගතයෙන් සංග්‍රහ කරයි.
- වැඩකට ගත නො හැකි දෙයක් දී සංග්‍රහ කරයි.
- උදව් කිරීමට අකැමැති නිසා වැඩක් එළඹුණු විට එහි වැරදි පැත්ත පමණක් පෙන්වා දෙයි.

**අනුප්පියභාණී මිත්‍රයාගේ ලක්ෂණ**

- හොඳ වැඩ ද අනුමත කරයි.
- නරක වැඩ ද අනුමත කරයි
- මුහුණට හොඳ කියයි.
- නැති තැන දොස් කියයි.

**අපායසහාය මිත්‍රයාගේ ලක්ෂණ**

- සුරාපානයේ ඇලීගැලී සිටීමට සහාය වෙයි.
- අවේලාවේ වීදි සංචාරය සඳහා නැවත නැවත යෙදීමෙහි සහාය වෙයි.
- උත්සව සන්දර්ශනවලට නිතර යාමෙහි සහාය වෙයි.
- සූදුවෙහි නැවත නැවත යෙදීමට සහාය වෙයි.

මේ පාප මිත්‍රයන්ගේ ලක්ෂණ හඳුනාගෙන ඔවුන්ගෙන් දුරින් ම දුරු වියයුතු බව "ආරකා පරිවජ්ජයේ" යන්නෙන් පැහැදිලි කෙරේ.

- ධම්මපදයේදී පාපමිත්‍රයන් ඇසුරු නො කරන ලෙසට අවධාරණය කර තිබෙන බවට

  "න භජේ පාපකේ මිත්තේ න භජේ පුරිසාධමේ ...

- පාපමිත්‍ර ඇසුර නිසා මෙලොව පරලොව අයහපත උදාවන බව

**(ලකුණු 04)**

**03. (V) "මවුපියන්ට උපස්ථාන කිරීම මංගල කරුණක් ලෙස මංගල සූත්‍රය අවධාරණය කරයි" වර්තමාන සමාජ තත්ත්වයට සාපේක්ෂව ඉහත ප්‍රකාශයෙහි වැදගත්කම අවධාරණය කරන්න.**

- මහා මංගල සූත්‍රයේ මංගල කරුණු තිස්අටක් දැක්වේ. එහි දැක්වෙන මාතා පිතු උපට්ඨානං යන්නෙන් මවට උපස්ථාන කිරීම හා පියාට උපස්ථාන කිරීම අර්ථවත් වේ.
- මවට පියාට උපස්ථාන කිරීම උතුම් මංගල කරුණක් බැවින් එය දියුණුවට හේතු වන බව.
- බ්‍රහ්ම, පුබ්බාචරිය, ආහුණෙය්‍යා ආදී විශේෂණයන්ගෙන් වෙසෙසා ඇති මව සහ පියා දරුවන්ගේ උපස්ථානයට ලක් විය යුතු ම බවට බුදුසමය අවධාරණය කරන බව.
- මවුපියන් පෙරදිසාව ලෙස සලකා යුතුකම් ඉටු කළයුතු යැයි සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන බව
- සුදොවුන් රජතුමාට, මහා ප්‍රජාපතී දේවියට හා මාතෘ දිව්‍ය පුත්‍රයාට අනුග්‍රහ දක්වා ඔවුන් සසර දුකින් මුදවා ගැනීමෙන් මවුපිය උපස්ථානයේ වැදගත්කම බුදුරදුන් විසින් ආදර්ශයෙන් පෙන්වා දී ඇති බව.
- මවුපියන්ට නොසැලකීම වර්තමානයේ විශාල සමාජ ගැටලුවක් බවට පත්ව ඇති බව.
- දරුවන් දෙමවුපියන්ට නො සැලකීම නිසා වැඩිහිටි නිවාස බිහිවීමේ ප්‍රවණතාවක් නිර්මාණය වන බව
- දරුවන් දෙමවුපියන්ට නො සැලකීම නිසා ඔවුන්ගේ ආයුෂ පිරිහෙන බව
- හැකියාව තිබියදීත් මහලුවියට පත් දෙමවුපියන් පෝෂණය නො කිරීම දරුවන්ගේ පිරිහීමට හේතු වන්නේ යැයි පරාභව සූත්‍රයේ දැක්වෙන බව
- දෙමවුපියන්ට නො සැලකීම වසලකරණ ධර්මයක් ලෙස වසල සූත්‍රයේ දැක්වෙන බව
- ඒ සඳහා රජය අමතර වැයක් දැරුව ද ඔවුන්ගේ මානසික පීඩාව දුරු කළ නො හැකි බව

**(ලකුණු 06)**

**04. (1) "ධන පරිභෝජනය පිළිබඳ බෞද්ධ ආකල්පය සමාජ සහජීවනයට මග පාදයි" ප්‍රමාණවත් සාධක මගින් සනාථ කරන්න.**

- බුදුසමයට අනුව ධනය වනාහි ගොඩගසාගත යුත්තක් නොව සංසරණය විය යුතු දෙයක් බව (කෝසල සංයුක්තය පඨම දුතිය අපුත්තක සූත්‍ර)
- උපයන ධනයෙන් තමා පිනවීම, දෙමාපියන් පිනවීම, අඹුදරුවන් පෝෂණය කිරීම, හිත මිත්‍රාදීන් පිනවීම, දාසිදස් කම්කරුවන් පිනවීම, මහණ බමුණන් විෂයෙහි දක්ෂිණාව පිහිටුවීම කළ යුතු බව. (භෝග සුඛය - අනණ සූත්‍රය)
- ධාර්මික ව උපයා ගත් ධනය පරිහරණය කළයුතු ආකාරය පත්තකම්ම සූත්‍රයේ සඳහන් වන බව.
    1. දැහැමි ව ලැබූ භෝගයෙන් තමා සුවපත් කරයි. පිනවයි. මවුපියන්, අඹුදරුවන්, දැසිදස් කම්කරුවන්, හිතමිතුරන් සුවපත් කරයි. පිනවයි.
    2. ධනය ආරක්‍ෂා කිරීම සඳහා ධනය යොදවයි.
    3. ඤාති බලි, අතිථි බලි, දේවතා බලි, රාජ බලි, පුබ්බපේත බලි යන යුතුකම් ඉටු කිරීම සඳහා ධනය යොදවයි.
    4. මහණ බමුණන් විෂයෙහි දන් දීම සඳහා ධනය යොදවයි.
- ඒකේන භෝගේ භුඤ්ජෙය්‍ය යනාදි ක්‍රමයට උපයන ධනය කොටස් හතරකට බෙදා ආයෝජනය, පරිභෝජනය හා සංරක්ෂණය සඳහා නුවණින් යෙදවිය යුතු බව
- සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන යුතුකම් ඉටුකිරීමට ධනය යෙදවිය යුතු බව
- සත්පුරුෂයාගේ ධනය පස්පියුමින් සැදි සිහිල් දිය පිරුණු රකුසන් අරක් නොගත් විලක ජලය මෙන් බොහෝ දෙනාගේ යහපතට හේතු වන අතර එය අපුත්තක සූත්‍රයේ සඳහන්ව තිබෙන බව
- සුරාව, සූදුව, කාමමිථ්‍යාචාරය වැනි සමාජයට හානි වන දුෂ්චරිත සඳහා උපයාගත් සම්පත් නො යෙදවිය යුතු යැයි සිගාලෝවාද සූත්‍රයේ දක්වා ඇති බව
- පුද්ගලයාට ධනය අවශ්‍ය බවත් එය නොමැතිවීම දුකක් බවත් දිළිඳුබව සමාජ ගැටලු විෂයෙහි පාදක වන බවත් බුදුසමය අවධාරණය කර තිබෙන බව
- ධනය ගොඩගසා ගන්නා පුද්ගලයා ධනයට ගැති වෙයි (ගථිතෝ) එයින් මුළාවට පත්වෙයි (මුච්ඡිතෝ) එහි ගිලීයයි (අජ්ඣාපන්නෝ) එහෙයින් ධනය පරිභෝජනය නො කරයි. ගොඩගසා ගනියි. එසේ ගොඩගසාගත් ධනය රජුන් හෝ සොරුන් හෝ පැහැර ගනීවි. ගින්නෙන් හෝ ජලයෙන් විනාශ වේවි. තමන් අප්‍රිය කරන පුද්ගලයන්ට එම ධනය අත්පත් වේවි. මෙසේ සිතා ධනය ගොඩගසා නොගෙන නිසි පරිදි පරිභෝජනය කළ යුතු බවට බුදුසමයේ දැක්වෙන බව

- උපයාගත් ධනය නිසි පරිදි පරිහරණය කිරීම සැපයක් ලෙස භෝග සුඛ යන්නෙන් අණන සූත්‍රයේ දක්වා ඇති බව
- පුද්ගලයෙකු ධනය උපයා ගොඩගසාගෙන සිටින්නේ නම් ඔහු නොකා නොබී මිය යන්නෙකු වන බව අජද්ධුමාරික යන වචනයෙන් ද සමාජයට හානිකර විනාශකාරී අධිපරිභෝජනය උදුම්බරඛාදික යන වචනයෙන් ද ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දක්වා ඇති අතර එම අන්ත දෙකෙන් වැළකීම බෞද්ධ පිළිවෙත බව
- රාසියගාමිණී සූත්‍රයේදී ධනය පරිහරණය පිළිබඳ උපදෙස් හතරක් පෙන්වා දී ඇති බව

1 දැහැමි ව ඉපයීම
2 තමා සැපවත් වීම
3 පරිත්‍යාග කිරීම
4 ගිජුකමින් තොරව පරිහරණය කිරීම

- දැහැමිව උපයාගත් ධනයෙහි පරිභෝජනය සහ පරිත්‍යාගය යන මූලික අර්ථ දෙකක් පවත්නා බව (දත්වා ච භුත්වා ච)

**(ලකුණු 10)**

**04. (ii) මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව කෙටියෙන් දක්වා මත් උවදුර පිටුදැකීමට බෞද්ධ ඉගැන්වීම්වලින් ලබාගත හැකි පිටිවහල ප්‍රමාණ කරන්න.**

- සිගාලෝවාද සූත්‍රයේ සඳහන් අපාය මුඛ හෙවත් භෝග විනාශ මුඛ හය අතුරෙන් පළමුවැන්න ලෙස මත්පැන් පානය සහ මත්ද්‍රව්‍ය භාවිතය දක්වා ඇති බව
- මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව හයක් සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන බව

1 බලා සිටියදීම ධනය විනාශවීම (සන්දිට්ඨිකා ධනජානි)

2 කලකෝලාහල බහුලවීම (කලහප්පවඩ්ඪනී)

3 විවිධ රෝගාබාධවලට ලක්වීම (රෝගානං ආයතනං)

4 අපකීර්තියට භාජනය වීම (අකිත්ති සඤ්ජනනී)

5 ලජ්ජාව නැතිවීම (කෝපීනනිදංසනී)

6 ප්‍රඥාව දුර්වල වීම (පඤ්ඤායදුබ්බලීකරණී)

**මත් උවදුර පිටුදැකීමට අදාළ බෞද්ධ ඉගැන්වීම්**

- පංචශීල ප්‍රතිපදාවේ අවසන් ශික්ෂාපදය වන "සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි'' යන්නෙන් මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකී සිටින ලෙස දක්වා ඇති බව

- මත්ද්‍රව්‍ය කෙරෙහි ලොල්වීම පුද්ගලයාගේ පරිහානියට හේතු වන කරුණක් ලෙස පරාභව සූත්‍රයේ දැක්වෙන බව (සුරා ධුත්තෝ)
- මත්පැන් පානයෙන් වැළකීම පුද්ගලයාගේ දියුණුව සලසන මංගල කරුණක් ලෙස මංගල සූත්‍රයේ දක්වා ඇති බව (මජ්ජපානා ච සඤ්ඤමෝ)
- මදයට හා ප්‍රමාදයට හේතු වන සුරාපානය පුද්ගලයාගේ කායික හා මානසික නීරෝගී භාවයට හානි පමුණුවන්නේ යැයි බුදුසමයෙන් අවධාරණය කර ඇති බව
- සුරාව මත්ද්‍රව්‍ය දුම්වැටි භාවිතය බොහෝ ගැටුම් හා සමාජ අසහනකාරී තත්ත්වයන් නිර්මාණය කරන බව
- මත්ද්‍රව්‍යවලින් වැළකීමෙන් පාපයට ඇති ලැජ්ජා භය, සංයමය, එළැඹ සිටි සිහිය, නිවැරදි දේ පමණක් කිරීම, දැහැමි ජීවන පිළිවෙත, මානසික සහනය, සමාජ පිළිගැනීම ආදි ධනාත්මක ආකල්ප වර්ධනය කර ගත හැකි බව
- මානසික සහනයෙන් හා තැන්පත් මනසකින් යුතු, නීතිවිරෝධී ක්‍රියා නො කරන මිනිසුන්ගෙන් හෙබි සාමකාමී වටපිටාවක් ගොඩනගාගැනීමෙහිලා මත්ද්‍රව්‍ය පිටුදැකීම අත්‍යවශ්‍ය සාධකයක් බව

**(ලකුණු 10)**

**05. (i) ත්‍රිවිධ ධර්ම සංගායනා සඳහා නායකත්වය දුන් මහ තෙරවරුන්ගේ සේවය ඇගයීමට ලක් කරන්න.**

**මහාකාශ්‍යප තෙරුන්**

- ප්‍රථම ධර්ම සංගායනාවට ආසන්නතම හේතුව වූ සුභද්‍ර භික්ෂුවගේ නො මනා ප්‍රකාශය පිළිබඳ නිහඬව සිටිය නො හැකි බව අවබෝධ කරගත් මහාකාශ්‍යප හිමි සංගායනාවක අවශ්‍යතාව භික්ෂූන්ට දැන්වීම.
- බුදුසසුනේ ආරක්ෂාව හා චිර පැවැත්ම වෙනුවෙන් ක්ෂණික ව ගතයුතු පියවර තේරුම් ගෙන සංගායනාව සංවිධානය කිරීම.
- සංඝයාගේ කැමැත්ත ලබා ගෙන වගකිව යුතු තීරණවලට එළඹීම.
- සංගායනාව හා සම්බන්ධ සියලු කටයුතුවලදී නායකත්වය ලබා දීම.
- මහාකාශ්‍යප මහ රහතන් වහන්සේ රජගහනුවර අවට වැඩ සිටි සියලු භික්ෂූන් රැස් කරවා සංගීතිය සඳහා සුදුසු භික්ෂූන් 500 නමක් තෝරා ගැනීම.
- සංගායනාව සඳහා තෝරාගත් භික්ෂූන් හැර සෙසු භික්ෂූන් රජගහනුවර වස් නො විසිය යුතු යැයි සංඝ ආඥාවක් පැනවීම.
- ප්‍රථම සංගායනාවේ මුලසුන දරමින් ධර්මය පිටක වශයෙන් බෙදා භාණක පරම්පරාවලට භාර දී එහි අනාගත ආරක්ෂාව තහවුරු කිරීම.

- බුද්ධානුබුද්දක ශික්ෂාපද වෙනස් නො කර එලෙසම පවත්වා ගෙන යාමට භික්ෂූන්ගේ අනුමැතිය ලබා ගැනීම.

**උපාලි තෙරුන්**

- සංගායනාවේදී විනය පිළිබඳ ඇසූ සියලු ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙමින් විනය පිළිබඳ සියලු ප්‍රඥප්ති සංගායනා සභාවට ඉදිරිපත් කිරීම.
- විනය පිටකය සුරක්ෂිත කිරීමට විනය භාණක පරපුරේ නායකත්වය ගැනීම.

**ආනන්ද තෙරුන්**

- සංගායනාවේදී ධර්මය පිළිබඳ ඇසූ සියලු ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙමින් බුදුරදුන් වදාළ සියලු ධර්ම කරුණු සංගායනා සභාවට ඉදිරිපත් කිරීම.
- දීඝ නිකාය සුරක්ෂිත කිරීමට දීඝ භාණක පරපුරේ නායකත්වය ගැනීම.

**සබ්බකාමී තෙරුන්**

- දෙවන සංගායනාවේ මුලසුන දැරුවේ සබ්බකාමී හිමියන් වීම.
- රේවත හිමියන් විසින් දස වස්තුව පිළිබඳව සබ්බකාමී හිමියන්ගෙන් විමසූ අතර උන්වහන්සේ එම දස වස්තුව අකැප යැයි හඳුනා ගැනීම.
- දස වස්තුව විනිශ්චය කිරීම සඳහා උබ්බාහිකාවක් පත් කිරීම.
- දස වස්තුවට අනුගත ව කටයුතු කළ වජ්ජිපුත්තක භික්ෂූන් හා ඊට සහාය පළ කළ දස දහසක් පමණ භික්ෂූන් අලජ්ජි, පාපී භික්ෂූන් ලෙස නම් කොට ථෙරීය භික්ෂු සංස්ථාවෙන් නෙරපා හැරීම.
- කාලාශෝක රජුගේ අනුග්‍රහය ලබා ගැනීම ආදී සේවාවන් සිදු කොට සම්බුදු සසුන ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම.

**යස තෙරුන්**

- වජ්ජිපුත්තක භික්ෂූන්ගේ විනය විරෝධී ක්‍රියා කලාපවලට එරෙහි වීම හා ඒවා නැවැත්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට මහතෙරවරුන් දැනුවත් කිරීම.
- සංගායනාවට අවශ්‍ය පසුබිම සකස් කිරීම.

**මොග්ගලීපුත්තතිස්ස තෙරුන්**

- තුන්වන ධර්ම සංගායනාවේ මුලසුන මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේ විසින් දැරීම.

- දුසිල් මහණුන් හැටදහසක් සසුනෙන් නෙරපා නිකාය දහඅටකට බෙදී සිටි භික්ෂූන් සමගි කරවා ශාසනය ශෝධනය කරවීම.
- සත් වසරක් නැවතී තිබූ ශාසනික විනය කර්ම නැවත ආරම්භ කිරීමට අදාළ ක්‍රියා මාර්ග ගැනීම.
- පරවාද මත පන්සියයක් ඛණ්ඩනය කරමින් ථෙරවාද මතය තහවුරු කිරීම සඳහා සකවාද ඉදිරිපත් කරමින් කථාවත්ථුප්පකරණය රචනා කොට අභිධර්ම පිටකය සම්පූර්ණ කිරීම.
- භාරතයේ විවිධ රාජ්‍ය සහ විදේශ රාජ්‍ය කිහිපයකට ම බුද්ධ ධර්මය හා බෞද්ධ සංස්කෘතිය ව්‍යාප්ත කිරීම පිණිස ධර්මදූත කණ්ඩායම් පිටත් කර යැවීම.

**(ලකුණු 10)**

**05. (ii) බුදුසසුනේ චිරස්ථිතිය උදෙසා පවත්වන ලද ධර්ම සංගායනා විෂයෙහි භාරතීය රජවරුන්ගෙන් ලද අනුග්‍රහය ප්‍රමාණ කරන්න.**

**අජාසත් රජු**

- ප්‍රථම ධර්ම සංගායනාවට පූර්ණ අනුග්‍රහය දක්වන ලද්දේ අජාසත්ත රජතුමා ය.
- එම සංගායනාව පැවැත් වූ රජගහනුවර වේභාර පර්වතය පාමුල සප්තපර්ණි ගල් ගුහාව ඉදිරිපිට රහතන් වහන්සේලා පන්සිය නමකට වැඩ සිටීමට හැකි වන පරිදි විශේෂ මණ්ඩපයක් ඉදි කිරීම හා සංගායනාව පැවැත්වීමට අවශ්‍ය ආරක්ෂාව තහවුරු කිරීම.
- රහතන් වහන්සේලා පන්සිය නමකට මාස හතක් සිවුපසයෙන් සංග්‍රහ කිරීම.
- මෙම සංගායනාව විශේෂ ආරක්ෂාව යටතේ පැවැත්වූ බව සංගායනාව හා සම්බන්ධ තොරතුරු විශ්ලේෂණයෙන් පැහැදිලි වේ. සැවැත්නුවරට වෙනත් භික්ෂූන්ට ඇතුල්වීමට ඉඩ නො දී රැකවලුන් යොදා තිබීමෙන් මෙම කරුණ සනාථ වේ. මෙම ආරක්ෂක විධිවිධාන යොදන ලද්දේ අජාසත් රජතුමා විසිනි.
- සංගායනාව ආරම්භයේ සිට අවසානය දක්වා පූර්ණ රාජ්‍ය අනුග්‍රහය ලබා දීම.

**කාලාශෝක රජු**

- වජ්ජිපුත්තක භික්ෂූන්ගේ බලපෑම නිසා නො මග ගිය කාලාශෝක රජු පසුව නන්දා තෙරණියගේ මග පෙන්වීම යටතේ කරුණු අවබෝධ කරගෙන

දෙවන ධර්ම සංගායනාව සඳහා මහරහතන් වහන්සේලාට අවශ්‍ය අනුග්‍රහය ලබා දීම.

- රහතන් වහන්සේලා හත්සිය නමකට මාස අටක් සිවුපසයෙන් සංග්‍රහ කිරීම හා ආරක්ෂාව ලබා දීම.
- සංගායනාවෙන් පසු දසදහසක් භික්ෂූන් ථෙරීය සම්ප්‍රදායෙන් නෙරපූ බව පාලි මූලාශ්‍රයේ සඳහන් වන අතර, රාජානුග්‍රහයකින් තොරව එවැනි වගකිව යුතු කටයුත්තක් සිදු කළ නොහැකි වීම.

**ධර්මාශෝක රජු**

- තුන්වන ධර්ම සංගායනාවට පූර්ණ අනුග්‍රහය ලබා දීම.
- පාඨලීපුත්ත නගරයේ තමා විසින් ඉදි කරන ලද අශෝකාරාමයේ සංගායනාවට අවශ්‍ය පහසුකම් සලසා දීම.
- නව මසක් තිස්සේ දහස් නමක් භික්ෂූන්ට සිවුපසය හා ආරක්ෂාව ලබා දීම.
- ඒ අනුව ලාභ සත්කාර අපේක්ෂාවෙන් සසුන්ගත වී සිටි දුසිල් මහණුන් හැටදහසක් හඳුනා ගෙන සසුනෙන් නෙරපා සාසන සංශෝධනයක් ඇති කිරීම.
- වසර හතක් නතර වී තිබූ පොහොය කර්ම කිරීමට භික්ෂූන්ට පහසුකම් සැලසීම.
- මොග්ගලිපුත්තතිස්ස මහ රහතන් වහන්සේට කථාවත්ථුප්පකරණය රචනා කිරීමට අනුග්‍රහය ලබා දීම.
- සංගායනාවෙන් අනතුරුව රටවල් නමයකට ධර්මදූත කණ්ඩායම් පිටත් කර හැරීම.

**කණිෂ්ක රජු**

- හතරවන සංගායනාව පැවැත්වීම හුදෙක් කණිෂ්ක රජුගේ අවශ්‍යතාව අනුව, එතුමාගේ ආරාධනයෙන් ම සිදු කෙරුණු අතර මේ සඳහා අවශ්‍ය සියලු පහසුකම් හා ආරක්ෂාව රජතුමා විසින් ම සලසා දීම.
- කණිෂ්ක රජතුමා සර්වාස්තිවාදී බෞද්ධ ඉගැන්වීම් පිළිබඳ විශේෂ ප්‍රසාදයෙන් කටයුතු කළ අනුගාමිකයෙකු වූ බැවින් කාශ්මීරයේ කුණ්ඩලවන විහාරය තෝරා ගෙන සර්වාස්තිවාදී ධර්ම සංගායනායක් ලෙස සංගායනාව පැවැත්වීමට සෘජුව මැදිහත් වීම.
- සිවුවන සංගායනාව පිණිස තත්කාලීන කීර්තිමත් සර්වාස්තිවාදී පඬිවරුන් වූ පාර්ශ්ව, වසුමිත්‍ර, වැනි තෙරවරුන්ගේ මෙන් ම නාගාර්ජුන, අශ්වඝෝෂ වැනි මහායානික වියතුන්ගේ ද සහාය ලබා ගැනීම.

- සිවුවන ධර්ම සංගායනාව අවසානයේ ත්‍රිපිටකයට විභාෂා ග්‍රන්ථ හෙවත් අටුවා සංස්කෘත භාෂාවෙන් රචනා කරන ලද අතර ඒ සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දීම.
- විභාෂා ග්‍රන්ථ තඹ පත්වල ලියවා ශෛලමය මංජුසාවක බහා නිදන් කොට මහා සෑයක් ඉදි කිරීම. (පෙෂාවෝර්)
- සිවුවන ධර්ම සංගායනාවෙන් පසු මධ්‍යාසියාව මෙන් ම විශේෂයෙන් ආසියාවේ උතුරුදිග රාජ්‍යයන් කරා ධර්ම ප්‍රචාරක සේවාවක් දියත් කිරීම.

**(ලකුණු 10)**

**06. (i) ජපන් සංස්කෘතියේ පෝෂණයට බුදුසමයෙන් ලද ආභාසය නිදසුන් සහිතව ඉදිරිපත් කරන්න.**

- බුදුසමය පැමිණීමෙන් පසු ජපන් සංස්කෘතියේ සෑම පැතිකඩක්ම බුදුදහමින් පෝෂණය වී ඇති බව.
- බෝධිසත්ත්ව සංකල්පය තුළින් සදාචාරවත් සමාජයක් බිහිවූ බව.
- බුදුදහම පැමිණීමට පෙර ප්‍රභූන්ට පමණක් සීමා වී තිබූ අධ්‍යාපනය සාමාන්‍ය ජනතාවට ද හිමි වූ බව.
- පන්සල් ආශ්‍රිතව පාසල් ආරම්භ වීම නිසා අධ්‍යාපනය බෞද්ධ මුහුණුවරක් ගත් බව.
- ආරාම ප්‍රජාසේවා මධ්‍යස්ථාන ලෙස ක්‍රියාත්මක වන බව. (අධ්‍යාපන මධ්‍යස්ථාන, මහලු නිවාස, සෞඛ්‍ය මධ්‍යස්ථාන ආදී ලෙස)
- බුදුසමයේ ආභාසයෙන් කලා ශිල්ප සංවර්ධනය වූ බව (ගෘහ නිර්මාණ ශිල්පය, කැටයම් කලාව, චිත්‍රකලාව, මූර්ති කලාව ආදී)
- රූකඩ, නාට්‍ය කලාව, මල් සැකසුම් කලාව, සංගීතය, තේ පානෝත්සවය, උද්‍යාන සැකසුම් කලාව, සටන් කලාව වැනි සංස්කෘතිකාංග මහායාන බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් ආරම්භ වී සංවර්ධනය වූ බව.
- හනමත්සුරි, ජෝදෝ, නෙහන්, ඔබොන් වැනි බෞද්ධ උත්සව ආරම්භ වූ බව.
- අවමංගල කටයුතු බුදුසමයේ ආභාසයෙන් විධිමත් ව සකස් වූ බව.
- සෙන් බුදුදහමට විශේෂ තැනක් හිමි වූ අතර භාවනාව තුළින් ආධ්‍යාත්මික ගුණ වගාවෙන් යුතු වැසියන් නිර්මාණය වූ බව.
- ජපන් වැසියන් මහායාන බෝධිසත්ත්ව ඇදහීම ඉහළින් ප්‍රගුණ කළ අතර ජපන් ජනජීවිතයට බෝධිසත්ත්ව ගුණ සම්ප්‍රේෂණය වීමෙන් පරාර්ථය අගයන සමාජයක් තුළ සමාජසේවා කටයුතු පුළුල් වූ බව.
- ශ්‍රේෂ්ඨ මානුෂීය ගුණාංග මිනිසුන් තුළ වර්ධනය වූ බව.
- විනෝදාස්වාදය ධාර්මික වූ බව.
- ආර්ථිකය හා දේශපාලනය ධාර්මික වූ බව.

**(ලකුණු 10)**

**06. (ii) චීන බුදුසමයේ සංවර්ධනය සඳහා ඉන්දු - චීන භික්ෂූන්ගෙන් ඉටු වූ මෙහෙය අගයන්න.**

- චීන බුදුසමයේ සංවර්ධනයට දායක වූ භාරතීය භික්ෂූන් ලෙස කුමාරජීව හිමි, පරමාර්ථ හිමි, ධර්මාකර හිමි, සංඝවර්මන් හිමි, බෝධිධර්ම හිමි වැනි භික්ෂූන් හඳුනාගත හැකිය.

**කුමාරජීව හිමි**

- මාධ්‍යමික සම්ප්‍රදායට අයත් කුමාරජීව හිමියන් විසින් මහාප්‍රඥාපාරමිතාශාස්ත්‍රය, ශතශාස්ත්‍රය වැනි ඉතා වැදගත් ධර්ම ග්‍රන්ථ චීන බසට පරිවර්තනය කර බුදුදහම හඳුන්වාදීමට ක්‍රියාකොට ඇති බව.

**පරමාර්ථ හිමි**

- චීනයට පැමිණ බෞද්ධ සංස්කෘත ග්‍රන්ථ චීන බසට පරිවර්තනය කොට බුදුදහම හඳුන්වා දීමට ක්‍රියා කර ඇති බව.

**ධර්මාකර හිමි**

- ක්‍රි. ව. 250 දී විනය කටයුතු සඳහා ධවල අශ්වාරාමයේ සීමා මාලකයක් පිහිටුවා භික්ෂු ශාසනය ආර්මභ කළ බව.

**සංඝවර්මන් හිමි**

- සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය ජනප්‍රිය කිරීමට කටයුතු කළ බව හා භික්ෂුණී ශාසනය ඇරඹීමට උපකාර කළ බව.

**බෝධිධර්ම හිමි**

- ක්‍රි.ව. 6වන සියවසේදී භාරතයේ සිට පැමිණි බෝධිධර්ම හිමි චාන් සෙන් හෙවත් ධ්‍යාන සම්ප්‍රදාය මගින් චීන ජනයාගේ ආධ්‍යාත්මික ශක්තිය අවදි කළ බව.

චීන බුදුසමයේ සංවර්ධනයට දායක වූ චීන භික්ෂූන් ලෙස හියුංෂියෑං භික්ෂුව, ෆාහියන් භික්ෂුව, තා ඕං භික්ෂුව, ඉට්සිං භික්ෂුව, හුයි යුවාං භික්ෂුව යන භික්ෂූන් ප්‍රමුඛ වන බව.

**හියුංෂියෑං භික්ෂුව**

- නාලන්දා විශ්වවිද්‍යාලයේ ශිල්ප ඉගෙන එහි ආචාර්වරයෙකු ලෙස සේවය කොට ධර්ම ග්‍රන්ථ 15000 පමණ ප්‍රමාණයක් පිටපත් කර ගෙන චීනයට රැගෙන ගිය බව. එසේ රැගෙන යන ලද ධර්ම ග්‍රන්ථ විශාල ප්‍රමාණයක් චීන බසට පරිවර්තනය කළ බව.

**ෆාහියන් භික්ෂුව**

- ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ සංචාරය කරමින් ධර්ම විනය ග්‍රන්ථ විශාල ප්‍රමාණයක් ඒකරාශී කොට චීනයට රැගෙන ගිය බව.

**තා ඕං භික්ෂුව**

- ධර්ම ග්‍රන්ථ චීන බසට පරිවර්තනය කිරීම හා විනය ග්‍රන්ථ ගවේෂණය කිරීම කළ බව.
  චීන භික්ෂු සංඝයා ආරාමවාසී සංස්ථාවක් බවට පත් කළ බව.

**ඉට්ෂිං භික්ෂුව**

- භාරතයට පැමිණ ධර්ම ග්‍රන්ථ විශාල ප්‍රමාණයක් එක් රැස්කොට චීනයට රැගෙන ගිය බව.

**හුයි යුවාං භික්ෂුව**

- දකුණු චීනයේ සංඝදේවයන්ගේ අභිධර්ම දර්ශනය, බුද්ධභද්‍රයන්ගේ ධ්‍යාන ක්‍රමය හා කුමාරජීවයන්ගේ ත්‍රිශාස්ත්‍රය ව්‍යාප්ත කළ බව.
- චීනයේ ප්‍රථම සංඝනායක ලෙස ද මෙම හිමියන් සැලකෙන බව.

**(ලකුණු 10)**

**07. (i) ශ්‍රී ලාංකේය ජනකවි හා ගීත කලාවේ පෝෂණයට බෞද්ධ ඉගැන්වීම්වලින් ලද ආභාසය විමර්ශනය කරන්න.**

- ශ්‍රී ලාංකේය ජනකවි හා ගීත කලාවේ පෝෂණයට බෞද්ධ ඉගැන්වීම් ප්‍රබල දායකත්වයක් ලබා දී ඇතිබව
- බෞද්ධ ඉගැන්වීම්වල ඇතුළත් මූලික ධර්ම කරුණු මෙන්ම පුද්ගලයා සුචරිතයට යොමු කරන සාරධර්ම ඇතුළත් ඉගැන්වීම් ද ලාංකේය ජනකවියට හා ගීතයට වස්තුවිෂය වී ඇති අයුරු දැක ගතහැකිය.
- කිසියම් කර්මාන්තයක යෙදුන ගැමියාගේ පාලුව, කාංසිය, මහන්සිය නිවා ගැනීමට ඔවුන්ගේ මුවගට නැගුන ප්‍රකාශයන්ට බුදුසමයේ දැක්වෙන ධර්ම සංකල්ප තේමා වී ඇති අයුරු දැක ගත හැකිය.
- පින් පව් කුසල් අකුසල් දිව්‍ය ලෝක අපාය මෙන්ම නිවන් සුවය පිළිබඳ හැඟීමෙන් ගැමි සමාජය කටයුතු කළ ආකාරය ඔවුන්ගේ නිර්මාණ ඇසුරෙන් පැහැදිලි වන බව.

ඉන්නේ දුම්බරයි මහ කළු ගලක් යට - කන්නේ කරවලයි රට හාලේ බතට
බොන්නේ බොර දියයි **පූරුවේ කළ පවට** - යන්නේ කවදා ද මවුපියො දකින්නට

තණ්ඩලේ දෙන්න දෙපොලේ දක්කනවා - කටුකැලේ ගාල නොලිහා වද දෙනවා
හපුතලේ කන්ද දැකලා බඩ දනවා - **පව්කළ** ගොනෝ ඇදපන් හපුතල් යනවා

අම්මාපල්ල බඹරුන් අත වැරදි නැති - කැලේ තියෙන මල්කාලා උන් රැකෙති
අනුන්කරන ගොවිපලකට හානි නැති - බඹර කපන අය **නරකාදියේ** යෙති

මා බාලේ ඇතිකළ තලගොයි පැටියා - මගෙ තනියට මිදුලේ වැලි කෙළ සිටියා
උගෙ මරුවා ඇවිදින් උං අරන් ගියා - **නිවන් පුරේ** පලයන් තලගොයි පැටියා

මල්ලියෙ ඔහොම නොකරන් අපෙ අම්මාට- දෙතනේ කිරි දුන්නෙත් අපි දෙන්නාට
තියෙන දෙයක් දුන්නෙත් අපි දෙන්නාට - **බුදුන් වඳින** ලෙස වැඳපන් අම්මාට
යන කවිවලින් උක්ත කරුණ තහවුරු කෙරෙන බව

- ගීත කලාවේ පෝෂණයට ද බෞද්ධ ආභාසය නොමඳ ව ලැබී ඇති අයුරු හෙළ ගීත සාහිත්‍යය තුළින් හඳුනාගත හැකිය. ඒ සඳහා නිදසුන් කිහිපයක් දැක්විය හැකිය.
    - සොරදෙටුවෙක් කස තැලුම් කකා, දන්ගෙඩියට ගෙන යන ගමනේ ......
    - අඩවන් වූ දෙනෙතින් ගලනා ......
    - සංසාරේ බවේ දුකා ......
    - පාරමිතා බල පූරිත පූජිත.......
    - දන්නෝ බුදුන්ගේ ශ්‍රී ධර්මස්කන්ධා ......
    - අඩු කුලේ කියාලා, ......
    - අමාදහර දිය ගලා ගලා ......
    - රජෙකු වුණත් ගිලන්වෙලා එක්තැන් වුණ දා.........

**(ලකුණු 10)**

**07. (ii) අනුරාධපුර මහාවිහාරය ථෙරවාද බුදුසමයේ කේන්ද්‍රස්ථානය වූ බව ප්‍රමාණවත් සාධක මගින් සනාථ කරන්න.**

- මිහිඳු මහරහතන් වහන්සේ විසින් හඳුන්වාදුන් ථෙරවාද බුදුසමයේ කේන්ද්‍රස්ථානය බවට පත් වූයේ මහා විහාරයයි. එය තහවුරු කිරීමට අදාළ සාධක රැසක් හඳුනාගත හැකිය.
- විනය ථෙරවාද බුදුදහමේ අනන්‍යතාව ලෙස සැලකෙන අතර එයට අනුගත ව මහාවිහාරය ක්‍රියාත්මක වීම
- බුදුදහම ලැබීමත් සමග මෙරට සිවුවනක් පිරිසක් ඇති වූ අතර මේ පිරිස ලංකාවේ විවිධ ප්‍රදේශවල විහාරාරාම ගොඩනගමින් බුදුසමය පතුරුවාලීමට කටයුතු කිරීම.
- ක්‍රි.පූ. පළමු සියවසේ වළගම්බා රාජ්‍ය සමය උදාවන තුරු මිහිඳු හිමියන් ස්ථාපිත කළ ථෙරවාද බුදුසමය මහාවිහාරය කේන්ද්‍රගත ව ව්‍යාප්තවීම නිසා රජු සහ ජනතාව බුදුසමය ආරක්ෂාකර ගැනීම සිය යුතුකම ලෙස සැලකීම
- ථෙරවාද අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය බවට මහාවිහාරය පත් වෙමින් ගිහි පැවිදි ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව අධ්‍යාපනය ලබා දීමට මහාවිහාරය හා අනුබද්ධ පිරිවෙන්වලින් අවස්ථාව උදාවීම.
- ථෙරවාද බුදුසමයේ සුරක්ෂිතතාව උදෙසා අරිට්ඨ තෙරුන් මුල් කරගත් සිංහල සංඝ සමාජයට විනය උගන්වා විනය සංගායනාවක් පැවැත්වීමට කටයුතු කිරීම.
- සීහළට්ඨකථා සම්පාදනය තුළින් දේශීය වශයෙන් ථෙරවාද අර්ථකථන සම්ප්‍රදායක් ගොඩ නැගුණු අතර ඒ අනුව මහාට්ඨකථා, මහාපච්චරියට්ඨකථා, කුරුන්දි අට්ඨකථා, අන්ධට්ඨකථා, සංඛේපට්ඨකථා ආදී අටුවා සම්පාදනය කිරීම
- ථෙරවාද ත්‍රිපිටක ධර්මය සුරක්ෂිත කිරීමෙහිලා භාණක සම්ප්‍රදායක් ඇති කිරීම, ක්‍රි. පූ. පළමු සියවසේ වළගම්බා රාජ්‍ය සමය තෙක් ථෙරවාද ත්‍රිපිටකය හා අටුවා ආරක්ෂා වූයේ මේ මගිනි.
- බැමිණිතියා සාගත අවධියේ ථෙරවාද බුදුදහම සුරක්ෂිත කරලීමට මහාවිහාරීය භික්ෂූන් දැඩි පරිශ්‍රමයක යෙදුණු බව
- බැමිණිතියා සාගතය මගින් ඇති කළ බලපෑම පදනම් කරගෙන මාතලේ අලු විහාරයේදී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට යොමුවීම
- ස්වාභාවික විපත් සමයන්හි මෙන්ම ථෙරවාද බුදුසමයට එරෙහි ව වෙනත් මතවාද (වෛතුල්‍යවාදය) හා ධර්මධාතු සංකල්පය වැනි අදහස් ද අභයගිරි අර්ථකථන ද නො පිළි ගැනීම
- මහසෙන් රජුගෙන් ඇති වූ අභියෝග හමුවේ නො සැලී ථෙරවාද බුදුසමය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම

- අටුවා සම්පාදනය සඳහා අවස්ථාව ලබා දෙන ලෙස බුද්ධඝෝෂ අටුවාචාරීන් විසින් කරන ලද ඉල්ලීමට විධිමත් බුද්ධි පරීක්ෂණයකින් අනතුරුව ඉඩ ලබාදීම. එමගින් ථෙරවාද සම්ප්‍රදායට අයත් අර්ථකථන සම්ප්‍රදාය ස්ථාපනය කිරීමට අවස්ථාව සලසාදීම
- කුල දරුවන් පැවිදි කොට නිසි ශික්ෂණයකින් යුතු සිංහල භික්ෂු පිරිසක් ලක්දිව පුරා ව්‍යාප්ත කිරීම

**(ලකුණු 10)**

**08. (i) බුද්ධ ප්‍රතිමා නිර්මාණයට පෙර බුදුරදුන් වෙනුවට භාවිත කරන ලද සංකේත ගෙනහැර දක්වා බුද්ධ ප්‍රතිමා කලාවේ ආරම්භය පිළිබඳ ප්‍රමාණවත් සාකච්ඡාවක් කරන්න.**

- බුදුරජාණන් වහන්සේගේ ආධ්‍යාත්මික ගුණ, රූපයකට නැගීමේදී මතු වී ඇති දුෂ්කරතාත්, බුදුරදුන් කෙරෙහි තැබූ අසීමිත භක්තිය, ගෞරවය හා බිය මුසු හැඟීමත් පදනම් කොට ගෙන බුද්ධ ප්‍රතිමාව මානවරූපීව නිරූපණය කිරීමට කලාකරුවන් උනන්දු නො වීම නිසා බුදුරදුන් වෙනුවට සංකේත භාවිතයට යොමුවී ඇත.
- ධර්මචක්‍රය, බෝධිය, සිරිපතුල, වජ්‍රාසනය, ඡත්‍රය, ස්තූපය, ස්වස්තිකය, පියුම, ත්‍රිරත්නය ආදී සංකේත බුද්ධ ප්‍රතිමා නිර්මාණයට පෙර භාවිත කර තිබූ බව
- සාංචි, භාරුත් හා අමරාවතී යන ස්තූප කැටයම්වලින් මෙබඳු සංකේත භාවිත කරන ලද බවට සාක්ෂි අනාවරණය වන බව

**බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය පිළිබඳව ඇති සාහිත්‍යාගත මතවාද**

- කෝසලබිම්බවර්ණනාවට අනුව බුදුරජාණන් වහන්සේ ජීවමාන අවධියේදී ම කොසොල් රජතුමා විසින් සඳුන් අරටුවකින් බුද්ධ ප්‍රතිමාවක් නිම කරවා ඇති බව
- කාලිංගබෝධි ජාතකයේ සඳහන් වන පරිදි බුදුරජාණන් වහන්සේ අනේපිඬු සිටුතුමාට ප්‍රතිමාවක් කරවීමට අවසර ලබාදුන් බව
- දිව්‍යාවදානයට අනුව බිම්බිසාර රජු බුදුරජාණන් වහන්සේගේ අනුමැතියෙන් උන්වහන්සේගේ රුව වස්ත්‍රයක අන්දවා රෝරුක නගරයේ රුද්‍රායණ රජුට තෑගි කොට යවා ඇති බව
- ධර්මාශෝක රජතුමා මහකාල නම් නාරජු මවා පෙන්වූ බුදුරුවට සත් දිනක් පුදපූජා කළ බව වංසත්ථප්පකාසිනියේ සඳහන් වන බව
- මිලිඳු රජු බුදුරුවක් නිර්මාණය කිරීම පිළිබඳ සඳහනක් මිලින්ද ප්‍රශ්නයේ සඳහන් වන බව.

**බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය පිළිබඳව ඇති පුරාවිද්‍යාත්මක සාධක**

- පුරාවිද්‍යාත්මක සාධක අනුව බුදුරජාණන් වහන්සේගේ රූපය මානවරූපාකාරයෙන් නිර්මාණය වී ඇත්තේ ක්‍රි. පූ. 1වන සියවසේ අග භාගයේ හෝ ක්‍රි. ව. 1වන සියවසේ මුල් භාගයේ කණිෂ්ක රාජ්‍ය සමයේ බව.
- මෝඑස්ගේ කාසි ක්‍රිස්තු පූර්ව 90-75 අතර කාලයට අයත් වන බව හා ඒවා රාජ හෝ දේව රූප විය හැකි බව
- බීමරාන් කරඬුවේ නිසැක වශයෙන් ම බුදුරුව දැකගත හැකි නමුත් එහි කාලනිර්ණය පිළිබඳ උගතුන් අතර එකඟතාවක් නැති බව
- කණිෂ්ක රජුට පෙර සිටි කුජුල කැඩ්පයිසස්ගේ ඛරොෂ්ඨී ශිලා ලිපියෙහි ගන්ධාරයේ තිබූ වර්ණාලේප කරන ලද බුදුපිළිමයක් පිළිබඳව සඳහන් වීම.
- ෂාජි කියේරිහි තිබී හමුවී ඇති ධාතු කරඬුවෙහි බුදුරුව දක්නට හැකි බව.
- කණිෂ්ක යුගයේ කාසිවල බුද්ධ රූපය නිර්මාණය කර තිබූ බව.

**(ලකුණු 10)**

**08. (ii) පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකකට ප්‍රමාණවත් විස්තර සපයන්න.**

**(1) බුද්ධ ප්‍රතිමාවේ ආසන**

- බුද්ධ ප්‍රතිමාවේ ආසන ප්‍රධාන වශයෙන් හතරක් ඇති බව

  1 පද්මාසනය
  2. වීරාසනය
  3. භද්‍රාසනය
  4. වජ්‍රාසනය

**පද්මාසනය**

- දණහිස් නමා යටිපතුල් උඩු අතට සිටින පරිදි දකුණු පාදය වම් කලවා උඩත් වම් පාදය දකුණු කලවා උඩත් සිටින ආකාරයෙන් හිඳීම හෝ පද්මයක ආකාරයට හිඳීම මෙහි ලක්ෂණය වන බව.
- **කමලාසන** හා **ධ්‍යානාසන** යන නම්වලින් ද හඳුන්වා ඇති බව.
- අට්ඨකථාවල මෙය හඳුන්වා ඇත්තේ **ඌරුබද්ධ** ආසනය නමින් බව.
- බුදුරජාණන් වහන්සේ වැඩසිටින ආකාරය දැක්වීමට ප්‍රතිමා ශිල්පීන් බහුලව මෙම ආසන ක්‍රමය යොදාගෙන ඇති බව.
- සමාධිය සංකේතවත් කිරීමට මෙම ආසනය භාවිත කර ඇති බව.

- ලංකාවේ පද්මාසනයෙන් යුතු ප්‍රතිමා සොයාගැනීම දුෂ්කර වුව ද ඉන්දියාව, බුරුමය, ථායිලන්තය, ඉන්දුනීසියාව වැනි රටවල මෙම ආසන ක්‍රමය බහුලව දැකගත හැකි බව.

**වීරාසනය**

- වම් පාදය දකුණු පාදය යටින් හා දකුණු පාදය වම් පාදය උඩින් සිටින අයුරින් තබා හිඳ ගැනීම මෙම ආසනයේ ලක්ෂණය බව.
- මෙය ඉන්දියානු ජාතිකයන් බිම හිඳගන්නා සාමාන්‍ය ක්‍රමය වන බව හා සුඛාසනය යනුවෙන් ද මෙම ආසනය හැඳින්වෙන බව.
- ලංකාවේ හිඳි ප්‍රතිමාවල බහුලව මෙම ආසන ක්‍රමය දැකගත හැකි බව.
- දැඩි අධිෂ්ඨානය මෙමගින් සංකේතවත් කෙරෙන බව.
- මහමෙවුනා උයන, තොලුවිල, ගල් විහාරය ආදී ඉපැරණි ස්ථානවල පිහිටි සමාධි බුද්ධ ප්‍රතිමා මෙම ආසනයෙන් යුක්ත බව.

**භද්‍රාසනය**

- තරමක් උසට තනන ලද විශේෂ පීඨිකාවක් මත හිඳ කලවා දෙපසට විහිදුවා ආසනයෙන් පහතට වැටෙන පා දෙක කුඩා පීඨයක් මත පිහිටන අයුරින් දැක්වීම මෙම ක්‍රමයේ ලක්ෂණය බව
- අකම්පාතාව සංකේතවත් කිරීමට මෙම ආසන ක්‍රමය යොදාගෙන ඇති බව
- අම්බලන්තොට රිදියගම විහාර භූමියෙන් මෙම වර්ගයේ පිළිමයක් හමුවී ඇති බව
- භද්‍රාසනය ලංකාවේ බුද්ධ ප්‍රතිමාවල දක්නට ලැබෙන්නේ ඉතා කලාතුරකින් වන බව හා ඉන්දුනීසියාව, ජාවා යන රටවල මෙම ආසනය බහුලව දැකගත හැකි බව

**වජ්‍රාසනය**

- දණහිස නවා දෙපතුල් උඩු අතට දෙකලවා මත තබා සිටීම මෙම ආසනයේ ලක්ෂණය වන බව
- මෙමගින් වීර්ය, බුද්ධත්වාවබෝධය හා බෝමැඩට පිටදී වැඩ සිටීම යනාදිය සංකේතවත් කෙරෙන බව
- පොළොන්නරුව ගල් විහාරයේ ඇති හිඳි පිළිමය වජ්‍රාසනයෙන් යුක්ත යැයි ආචාර්ය ආනන්ද කුමාරස්වාමිගේ අදහස වන බව හා ඒ හැරුණු කොට මෙම ආසනයට අදාළ ප්‍රතිමා ලංකාවෙන් සොයාගැනීම දුෂ්කර බව
- මහායාන බුද්ධ ධර්මය පැතුරුණු ටිබෙට්, චීන, ජපන් යන රටවල වජ්‍රාසනය බහුල ව දැකිය හැකි බව

(2) වටදාගෙය

- කුඩා හා මධ්‍යම පරිමාණයේ චෛත්‍යයන්හි ආරක්ෂාව සඳහා ගල් කණුවලින් වට කොට ඒ මත පියස්සක් තනා ඉදිකළ වෘත්තාකාර ගෘහය වටදාගේ නමින් හැඳින්වෙන බව
- ථූපසර හා සැගෙය යනුවෙන් ද එය හැඳින්වෙන බව
- පරණවිතාන මහතාගේ අදහසට අනුව ථූපසර, චේතියඝර, ධාතුඝර, ධාතුගේහ යන මේ සෑම වචනයක් ම එකම වර්ගයේ ගොඩනැගිල්ලක් සඳහා භාවිත කර ඇති බව
- මහාවංසයෙහි සඳහන් වන තොරතුරුවලට අනුව ලංකාවේ ප්‍රථමවරට වටදාගෙයක් ඉදි කරවන ලද්දේ වසභ රජතුමා විසින් බව
- සිලාමේඝ රජු ථූපාරාමයේ ගෘහයෙහි දිරාපත් වූ දොරටු ප්‍රතිසංස්කරණය කිරීමේ පුවතින් වටදාගෙය සඳහා ඇතැම්විට දොරවල් ද තිබෙන්නට ඇතැයි සිතිය හැකි බව
- ඉන්දියාවේ පැවති චෛත්‍යශාලාවලින් ලක්දිව වටදාගේ සඳහා පූර්වාදර්ශ ලබාගන්නට ඇතැයි සැලකෙන බව
- මුල් කාලයේ ථූපාරාමය, ලංකාරාමය, අම්බස්තල ථූපය වැනි කුඩා ස්තූපවලට චේතියඝර ඉදිකළ බවට සාක්ෂි හමුවන බව
- ථූපඝරය නමින් හැඳින්වූ මෙම ස්මාරකය නවීකරණය කිරීමෙන් අනතුරුව එය ධාතුඝර නමින් ද හඳුන්වා ඇති බව
- විවිධ රජවරු ධාතුඝර ප්‍රතිසංස්කරණය කර ඇති බවට තොරතුරු ලැබී ඇති බව
  උදා: ගෝඨාභය රජු ථූපාරාමය, අම්බස්තල හා මණිසෝම යන ධාතුඝර ද හයවන අග්ගබෝධි රජු ථූපාරාම ධාතුගෘහයේ දිරාපත් වී තිබූ දොරටුව ප්‍රතිසංස්කරණය කිරීම
- ධාතුඝර යන්න සංවර්ධනය වීමෙන් වටදාගෙය යන්න නිර්මාණය වී ඇති බව
  උදා: ථූපාරාම වටදාගෙය, පොළොන්නරුව වටදාගෙය
- මුල් කාලයේ ස්තූපය ආරක්ෂා කිරීම මෙහි අරමුණ වී ඇතත් පසුව ඒ වටා වන්දනා කිරීම සඳහාත් තැන්පත් කර තිබූ බුදුපිළිම හා ආසන අව්වැසිවලින් ආරක්ෂා කිරීමත් අරමුණ වී ඇති බව

### (3) සතර සංග්‍රහ වස්තු

- සතර සංග්‍රහ වස්තු යනු පුද්ගලයකු විසින් සමාජයේ වෙසෙන අනික් තැනැත්තන්ට සංග්‍රහ කළයුතු ආකාර හතරක් වේ. ඒවා දානය, ප්‍රිය වචනය, අර්ථචර්යාව, සමානාත්මතාව නම් වන බව.
- බෞද්ධ දේශපාලන මූලධර්ම අතර රාජ්‍යයක් පාලනය කිරීමේදී පාලකයා විසින් පාලිතයන් විෂයයෙහි මුදාහළ යුතු එම සර්ව ශුභසාධන ක්‍රම ලෙස දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව හා සමානාත්මතාව හඳුන්වාදිය හැකි බව

#### 1. දානය

- දානය යන්නෙන් දන් දීම මෙන් ම කාලය, ශ්‍රමය හා වෙනත් භෞතික සම්පත් අන් අය වෙනුවෙන් කැප කිරීම ද සලකා ගත හැකි බව.
- දේශපාලන මූලධර්මයක් ලෙස සැලකීමේදී දානය යනු රටවැසියාට යහපත් ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය ජීවනෝපාය මාර්ග, යටිතල පහසුකම්, සුබ සාධනය ආදිය නිසි පරිදි පැවැත්වීම වන බව.

#### 2. ප්‍රියවචනය

- ප්‍රියවචනය යනු අන් අයගේ සිතට සහනයක්, සුවයක් ගෙන දෙන ප්‍රිය භාෂණයයි. එනම් මුසාවාදා පිසුනාවාචා ඵරුසාවාචා සම්ඵපලාපා යන පව්ටු වදනින් වැළකී මධුභාණී, පුප්ඵභාණී යැයි කී ලෙසින් මිහිරි වදනින් අනුන්ට සංග්‍රහ කිරීම.

#### 3. අර්ථචර්යාව

- "අත්ථචරියාති අත්ථ වඩ්ඪන කථා" යනුවෙන් දැක්වෙන පරිදි අන් අයගේ භෞතික හා ආධ්‍යාත්මික දියුණුව, අභිවෘද්ධිය වෙනුවෙන් වෙහෙස මහන්සි වී කටයුතු කිරීම.

#### 4. සමානාත්මතාව

- සමානත්තතාති "සමාන සුඛ දුක්ඛා" යනුවෙන් දැක්වෙන පරිදි ජාති කුල ආගම් වර්ණ දුප්පත් පොහොසත් ආදි පන්ති භේද නො සලකා අන් අය ද දුක සැපේදී සමාන බව සලකා කටයුතු කිරීම.

මෙම සතර සංග්‍රහ වස්තුව රිය සකට කඩඇණය මෙන් සමාජයේ යහ පැවැත්මට උපකාරී වන බව සිගාලෝවාද සූත්‍රයේ සඳහන් වීම

## (4) නාලන්දා විශ්වවිද්‍යාලය

- ක්‍රි.ව. 415- 455 තෙක් රජ කළ **ශක්‍රාදිත්‍ය** හෙවත් **පළමුවන කුමාරගුප්ත** රජතුමා විසින් නාලන්දාවේ පළමු සංඝාරාමය ගොඩනැගූ බව
- විවිධ රාජ්‍ය කාලවලදී නාලන්දා විශ්වවිද්‍යාලය සංවර්ධනයට පත්ව ඇති බව
  උදා: බුද්ධගුප්ත රජු ( ක්‍රි.ව. 455 - 467) ශක්‍රාදිත්‍ය රජු තැන වූ සංඝාරාමයට දකුණු දෙසින් තවත් සංඝාරාමයක් ගොඩනැංවීම, ක්‍රි.ව. 467 - 500 තෙක් රජකළ තථාගතගුප්ත හෙවත් වික්‍රමාදිත්‍ය රජු ඊට නැගෙනහිර දෙසින් තුන් වැනි සංඝාරාමය ද, බාලාදිත්‍ය රජු (ක්‍රි.ව. 500 - 525) ඊට ඊසාන දෙසින් සිවුවැනි සංඝාරාමය ද අඩි 300ක් උසැති පිළිම ගෙයක් ද කරවීම
- වර්තමානය වනවිට ශේෂව පවතින පුරාවිද්‍යාත්මක නටබුන්වලින් හා දේශාටන වාර්තාවලින් නාලන්දා විශ්වවිද්‍යාලය පිළිබඳ බොහෝ තොරතුරු අනාවරණය කරගත හැකි බව
- හියුංසියැංගේ භ්‍රමණවෘත්තාන්තයට අනුව මෙහි උස් ගොඩනැගිල්ලක් මුදුනේ ආකාශ වස්තු පර්යේෂණාගාරයක් ද විය. උඩු මහල්වල ජනෙල්වලින් චන්ද්‍රග්‍රහණ, සූර්යග්‍රහණ යනාදිය මෙන්ම වලාකුළු ගමනාගමනය ද නැරඹිය හැකි විය. තවත් ගොඩනැගිල්ලක රසායනාගාරයක්, වෛද්‍ය විද්‍යාලයක් හා රෝගී නේවාසිකාගාරයක් ද පැවතියේ යැයි කියැවෙන බව
- නාලන්දා විශ්වවිද්‍යාලය සතුව විශාල පුස්තකාලයක් තිබූ බවට විස්තර තිබ්බතීය වාර්තාවල සඳහන් වෙයි. එය "ධර්මගඤ්ජි" නමින් හැඳින් වූ අතර රත්නසාගර, රත්නෝධදි හා රත්නරඤ්ජන යන නාමයන්ගෙන් යුත් මන්දිර තුනකින් සමන්විත වූ බව
- රත්නෝධදි නමැති පුස්තකාල මන්දිරය තට්ටු නවයකින් සමන්විත වූ බවත් මහායාන ග්‍රන්ථ පමණක් එහි පැවති බවත් කියැවෙන බව
- ඉතා සුළු ප්‍රමාණයක් කැණීම් කර ඇති විශ්වවිද්‍යාල භූමියෙන් බුද්ධ ප්‍රතිමා, බෝසත් ප්‍රතිමා, දේව ප්‍රතිමා, ශිලා ලේඛන, රාජ මුද්‍රා, විශ්වවිද්‍යාලයීය මුද්‍රා ආදිය සොයාගෙන තිබීමෙන් මනා සංවිධානාත්මක ව්‍යුහයකින් යුත් අධ්‍යාපන ක්‍රියාවලියක් නාලන්දාවෙහි පැවති අයුරු අනාවරණය වන බව
- භික්ෂූන් වහන්සේලා හා බ්‍රහ්මචාරී වශයෙන් හැඳින් වූ ගිහි පිරිස වශයෙන් මෙහි අධ්‍යාපනය ලැබූවන් ප්‍රධාන කොටස් දෙකක් යටතේ වර්ග කළ හැකි බව
- හියුංසියැංගේ වාර්තාවට අනුව නේවාසික සංඛ්‍යාව ආචාර්යවරු - සේවකයන් - ශිෂ්‍ය පිරිස **යනුවෙන්** කොටස් තුනක් යටතේ බෙදා දැක්විය හැකි බව
- ද්විතියික අධ්‍යාපනය සඳහා විශ්වවිද්‍යාලයට ඇතුළත් වන සිසුන්, ප්‍රථම උපාධිය ලැබීමට වයස අවුරුදු 20දී පමණ විශ්වවිද්‍යාලයට ඇතුළු වන සිසුන්, දේශීය හා

විදේශීය අධ්‍යාපන ආයතනවලින් උසස් අධ්‍යාපනය හදාරා පශ්චාද් උපාධි අපේක්ෂකයින් ලෙස ඇතුළු වන සිසුන් ලෙස අධ්‍යාපනය ලත් ශිෂ්‍ය පිරිස කොටස් තුනක් යටතේ වර්ග කර දැක්විය හැකි බව

- නාලන්දා විශ්වවිද්‍යාලයට සිසුන් ඇතුළත් කර ගැනීමේදී ජාතිය, කුලය, ගෝත්‍රය යනාදි සාධක කිසිවක් සැලකිල්ලට නො ගැනිණි. විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අත්‍යවශ්‍ය සාධකය වූයේ දැනුම හා යහපත් චර්යාවයි. එහිදී සංස්කෘත භාෂාව, වාග් විද්‍යාව, තර්ක ශාස්ත්‍රය, අභිධර්ම කෝෂය, ජාතක මාලා ආදිය පිළිබඳ මනා පටුත්වයක් අවශ්‍ය වූ බව
- නාලන්දා විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු ප්‍රධාන විෂය ධාරා පහක් යටතේ සිදු කර ඇති බව
    - i. භාෂා විෂය ධාරාව
    - ii. බුද්ධ ධර්මය විෂය ධාරාව
    - iii. දර්ශන විෂය ධාරාව
    - iv. ලෞකික විෂය ධාරාව
    - v. ලලිතකලා විෂය ධාරාව
- දේශන, විවාද හා පෞද්ගලික සාකච්ඡා ක්‍රමය වශයෙන් ඉගැන්වීම් ක්‍රමවේද තුනක් භාවිත කර ඇති බව
- නාලන්දා විශ්වවිද්‍යාලයේ පාලන කටයුතු කුලපතිවරයෙකු යටතේ සිදු වූ බව
- කුලපති යටතේ ප්‍රධාන කෘත්‍යාධිකාරී මණ්ඩල දෙකක් පැවති අතර සමස්ත විශ්වවිද්‍යාලයේම පාලන කටයුතු එම මණ්ඩල දෙක මගින් මෙහෙයවා ඇති බව
- නාලන්දා විශ්වවිද්‍යාලය ජාත්‍යන්තර වශයෙන් කීර්තියට පත් වීම සඳහා එහි සිටි වියත් ආචාර්ය මණ්ඩලය ද ප්‍රබල ලෙසම හේතු වූ බව

  උදා: රාහුලභද්‍ර, අසංග, වසුබන්ධු, දින්නාග, ගුණමති, ස්ථිරමති, ජයදේව, චන්ද්‍රකීර්ති, ප්‍රභාමිත්‍ර, චන්ද්‍රගෝමීන්, ජිනමිත්‍ර, ධර්මපාල, ශීලභද්‍ර, ධර්මකීර්ති, ශාන්තිදේව, ශාන්තරක්ෂිත, කමලශීල, බුද්ධකීර්ති යන හිමිවරු
- මෙසේ ලොව සුපතළ කීර්තිමත් විශ්වවිද්‍යාලයක් වූ නාලන්දාව දහතුන් වැනි සියවසේ මුස්ලිම් ආක්‍රමණිකයන් විසින් විනාශයට පත් කළ බව

**(ලකුණු 5x2=10)**